# ලෝකාලෝකය

2014 ජූනි / ජූලි

**ස්වාමීන්වහන්සේ ගැන බලා සිටින්නෝ තමුන්ගේ**
**සවිය අලුත්කරගන්නෝය;**
**ඔව්හු රාජාලීන් මෙන් පියාඹා නගින්නෝය;**
**ඔව්හු දුවන්නෝය, එහෙත් වෙහෙස නොවෙති;**
**ඔව්හු ඇවිදින්නෝය, එහෙත් ක්ලාන්ත නොවෙති.**

(යෙසායා 40:31)

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය, 7, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 6.
www.christianfellowshipcentre.com

# ඇදහිලිවන්ත භාර්යාවන්ට ඔවදනක්

❖ ඔබේ සැමියා මුළු ජීවිත කාලය පුරාම ඔබ සමඟ සිටින බැවින් මව, පියා, දුව, පුතා හෝ අන් කිසිවකුට වඩා ගෞරවයක්, උසස් ස්ථානයක් හා ආදරයක් ඔහුට ඔබගේ ජීවිතයේ ලබා දෙන්න.

❖ දේව වචනයට පටහැනි නොවන ආකාරයට, එහෙත් ඔබගේ සැමියාගේ සිතැගියාවට අනුව, ඔබගේ ඇඳුම් පැළඳුම්, හැසිරීම, කතාබහ, ආශ්‍රයන් හා ගමන් බිමන් හසුරුවා ගන්න.

❖ විනීත භාවය, පවිත්‍ර භාවය, ගැහැණුකම, විනය, හැසිරීම, කතා විලාශය වැනි සුචරිත ගුණාංග අමතක නොකර ඒවා දියුණු කර ගන්න. ආත්මය ගැන පමණක් නොව ශරීරය පිළිබඳව ද සැලකිලිමත් වන්න. පිරිසිදුව හා ලස්සනට සිටින්න.

❖ සැමියාට යටහත් පහත්ව සිටින්න. ඊට ඔහුගේ දුර්වලතා බාධාවක් කර නොගන්න. "මක්නිසාද පුරාණ කාලයෙහි දෙවියන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වුන ශුද්ධ වූ ස්ත්‍රීවරු තමන්ගේ පුරුෂයන්ට යටහත්ව මෙලෙස අලංකාර වුණෝය. එලෙස සාරා ආබ්‍රහම්ට ස්වාමියායයි කියමින් කීකරුවුණාය. නුඹලාත් කිසි භීතියක් කරණකොට ගෙන භයනොවී යහපත කරන්නහු නම් ඇගේ දරුවෝව සිටින්නහු ය" (1 පේතෘස් 3 : 5-6). **"භාර්යාවෙනි ස්වාමීන්වහන්සේ තුළ සුදුසුව තිබෙන ලෙස නුඹලාගේ පුරුෂයන්ට යටත්ව සිටපල්ලා" (කොලොස්සි 3 : 18). "එබැවින් සභාව ක්‍රිස්තුස්වහන්සේට යටත් වෙන්නාක් මෙන් භාර්යාව සියලු දේවලදී තමුන්ගේ පුරුෂයන්ට යටහත් වෙත්වා" (එපීස 5 : 24).**

❖ සැමියාගේ දුර්වලතාවයන් තිබුනත් ඒවා නිවැරදි කිරීමට ඔබගේ දිව මුවහත් නොකරන්න. මෘදු ලෙස ඒවා ගැන ඔහු සමඟ කතා කරන්න. එමෙන්ම ඔබගේ යටහත් හා මෘදු ප්‍රේමයෙන් ඔහුව දිනා ගන්න. සැර පරුෂ කමෙන් පුරුෂයෙකු හරවා ගැනීමට හෝ නිවැරදි කිරීමට නොහැකි බව මතක තබා ගන්න. **"එසේම භාර්යාවරුනි නුඹලාගේ පුරුෂයන්ගෙන් සමහරෙක් වචනයට අකීකරුව සිටියත්, ඔවුන් නුඹලාගේ පිරිසිදු වූ යටහත් හැසිරීම දුටුවාම වචනය නැතුව භාර්යාවන්ගේ හැසිරීම කරණකොටගෙන දිනාගන්නා පිණිස ඔවුන්ට යටත් වෙයල්ලා" (1 පේතෘස් 3 : 1-2).**

❖ සැමියාගේ වැරදි, අඩු ලුහුඬුකම් ගැන මව, පියා, නැන්දා, මාමා, අසල්වැසියා, සභාවේ අය, සභා නායකයා හෝ සභාපාලකයා සමඟ නොකියන්න. නමුත් රහසිගතව ස්වාමීන්වහන්සේට කියන්න.

❖ එකිනෙකාගේ කාරණාවලට මැදිහත් නොවන්න. ඕපා දූප කතා කිරීම, ගෙයින් ගෙට යෑම වැනි කාලය කා දමන වැඩ වලින් දුරුව සිටින්න. ඒ වෙනුවට බයිබලය කියවීම, යාච්ඤා කිරීම, යමක් ඉගෙන ගැනීම වැනි ප්‍රයෝජනවත් දෙයක යෙදෙන්න.

❖ ඔබ අසන දකින සියළු දේ සැමියාට නොපවසන්න. විශේෂයෙන්ම අන් අයගේ දුර්වලතාවයන් හා වැරදි. එමෙන්ම තම සැමියාට දොස් පැවරීමට කිසිවකුට ඉඩ නොතබන්න. ඔබගේ සැමියා ආරක්ෂා කරන්න. දරුවන් හෝ අන් අය ඉදිරියේ සැමියාගේ වැරදි කතා නොකරන්න.

16 පිටුවට.....

# ඇදහිල්ලේ ගති ලක්ෂණ

මගේ ප්‍රේමවන්ත සහෝදර සහෝදරියනි, එක එක මනුෂ්‍යයා ඇසීමට ඉක්මන් වේවා ! කතා කිරීමටත් උදහස්වීමටත් ප්‍රමාද වේවා ! (යාකොබ් 1:19)

ප්‍රිය ලෝකාලෝක පාඨක සහෝදර සහෝදරියනි. අපගේ ගැලවුම්කාර ප්‍රේමවන්ත ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහත් කරුණාව, සැනසීම හා ආශීර්වාදය සෑම නිමේෂයකම ඔබ සමග වේවා! 2014 අප්‍රේල් ජුනි - ජුලි කලාපය ඔබ අතට පත් කිරීමට ලැබීම මහත් ප්‍රීතියකි. මහෝත්තම දෙවියන්වහන්සේගේ පිහිට උපකාරය හා නුවණ, ප්‍රඥාව නොඅඩුව ඒ සඳහා ලැබුණු අතර ඒ ගැන මාගේ නමස්කාර පූර්වක ස්තුතිය පිය වූ දෙවියන්වහන්සේට පුද කරමි.

යාකොබ් පොත ඇදහිල්වන්තයන්ගේ ප්‍රායෝගික ජීවිතය පිළිබඳ අත්පොතයි. කිතුණුවන් අතර හෝ, දේශකයන් අතර හෝ සභාවේ වැඩි සාකච්ඡාවට ලක් නොවන යාකොබ් පොත යේසුස්වහන්සේට සැබෑ ලෙස ප්‍රේම කරන්නන්ට නම් මහත් රන් ආකරයකි. ඔබත් යාකොබ් පොත අධ්‍යයනය කර සැබෑ යේසුසවහන්සේගේ අනුගාමිකයකු ලෙස ජීවත් වෙන්නට උත්සහ කරන්න. පහත දැක්වෙන්නේ යාකොබ් තුමා විස්තර කරන ඇදහිලිවන්තයාගේ ලක්ෂණ කිහිපයක් ඉතාම කෙටියෙන්ය.

### ඇදහිල්ලේ ගති ලක්ෂණ

දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වන මනුෂයා තුළ තිබිය යුතු ගතිගුණ කිහිපයක් ශුද්ධාත්මයන්වහන්සේ යාකොබ් තුලින් අප වෙත ගෙන එයි.

### 1. ඇදහිල්ල දේව වචනයට කීකරු වෙයි (යාකොබ් 1: 19-27 ඉවසිල්ලෙන් කියවන්න)

වචනය අසන්නෝ පමණක් නොවී................. 22 පදය, එනම් වචනය ඇසීමෙන් නොනැවතී ඉන් ඔබ්බට තවත් පියවරක් තිබෙන බව යාකෝබ් පවසයි. දෙවියන්වහන්සේගේ ආනුභාවයෙන් දෙනු ලැබූ උන්වහන්සේගේ කැමැත්ත සහිත වචනය අප විසින් පළමුව කියවන්නට හා පරිශීලනය කිරීමට පුරුදු පුහුණු විය යුතුය. ඉන් පසු ඉදිරි පියවර වන වචනයට කීකරු වීම ශුද්ධාත්මයාණන්වහන්සේගේ අභාවයි. අසන ලද වචනය, කියවන ලද වචනය, දේශණා කරන ලද වචනය මනසට, හදවතට අතුල් කර ඊට කීකරුවී දෙවියන්වහන්සේගේ අනුග්‍රහය කරුණකොට ගෙන දිනපතා ජීවිතයට වචනය අදාල කර ගැනීම මගින් සැබෑ ක්‍රිස්තු අනුගාමිකයකු ලෙස ලෝකයට ආලෝකයක් ලෙස ජීවිත් විය හැක. ඇදහිලිවන්තයාගේ ප්‍රධාන ගතිගුණ ලෙස යාකොබ් තුමා අපට පෙන්වා දෙන්නේ දෙවියන්වහන්සේගේ වචනයට කීකරු වීමයි.

### 2. ඇදහිල්ල සියලු බේද එපා කරයි (යාකොබ් 2: 1-13 ඉවසිල්ලෙන් කියවන්න)

දෙවියන්වහන්සේගේ කරුණා - අනුග්‍රහය විශ්වාස කරන්නා මිහිමත ඇති සියලු බෙදීම් නොසලකා හරියි. එපා කරයි. ජාති භේද, ආගම් භේද, කුල භේද, දුප්පත්- පොහොසත් භේද, උගත් - නුගත් භේද දෙවියන්වහන්සේ කෙරෙහි අදහිල්ල විසින් විනාශ කර දමයි. මක්නිසාද දෙවියන්වහන්සේ තරාතිරම් නොබලන සේක. මෙලොව පවතින වෙනස්කම් හා භේද ඇදහිල්ලට අයිති නොවූ එහෙත් යක්ෂයාට අයත් මාංශික ගතිලක්ෂණය. ඇදහිලවන්තයා මේ ලොවට අයිති නොවූ හෙයින් ඔහුට මේ ලෝකයේ කාරණා පිළිබඳ වැඩි වගකීමක් නැති බැවින් ඇදහිල්ල අයිති කාරණා වලට යොමු වී සියලු මායිම් කඩා දමා සියලු භේද එපා කර සැබෑ ක්‍රිස්තු අනුගාමිකයෙකු වන්න.

### 3. ඇදහිල්ල ක්‍රියාවේ යොදවයි (යාකොබ් 1 :14-26 ඉවසිල්ලෙන් කියවන්න)

"ඇදහිල්ල ක්‍රියා නැතිව තනියම තිබේනම් මැරිලාය............" 17 පදය මෙම වාක්‍යය යාකොබ් තුමා ප්‍රකාශ කරන්නේ තම අත්දැකීම් පදනම් කරගෙන බව මගේ හැගීමයි. මක්නිසාද ඔහු යෙරුසලම් සභාවේ නායකයාය. ඇදහිල්ල ඇතුව සිටින්නා දෙවියන්වහන්සේ හා යේසුස්වහන්සේගේ ක්‍රියා පිළිබඳ නිරනතරයෙන් සිහිපත් කරයි. එම සිතිවිලි මගින් යමෙක් ක්‍රියාවක් කිරීමට පොළඹවයි. එම ක්‍රියාව සැබැවින්ම යහපත් වෙයි. යමෙක් උනන්දුවෙන් හා කැපවීමෙන් යහපත් වැඩවල යෙදේ නම් අන්න! ඔහු තුල ඇදහිල්ල ක්‍රියාත්මක වන බව තේරුම් ගන්න. ඇදහිලිවන්යා මවා ඇත්තේ යහපත් ක්‍රියා කරන පිණිස බව පාවුල් තුමා පවසයි. ඇදහිල්ල සෑම විටම යහපත් ක්‍රියාවෙන් පූර්ණය.

### 4. ඇදහිල්ල දිව පාලනය කරයි.
### (යාකොබ් 3:1-12 ඉවසිල්ලෙන් කියවන්න)

දිව අපට ඇති ඉතාමත් ප්‍රයෝජනවත් හා භායනකම අවයවයකි. අපගේ හදවත තුළ උපදින සිතුවිලි පිටතට ගෙන එනු ලබන්නේ දිව මගිනි. විවිධ ආරවුල් හා කරදර වලට මුලික වන්නේ දිවමය. නමුත් ඇදහිල්ල මගින් දිව පාලනය කරයි නම් එය දෙවියන්වහන්සේ විසින් පාලනය කරනවා වැනිය.

### 5. ඇදහිල්ල ඥාණය උපදවයි
### (යාකොබ් 3:13-18 ඉවසිල්ලෙන් කියවන්න)

"ඉහළින් පැමිණෙන ප්‍රඥාව පළමුකොට පිරිසිදුය.................." 17 පදය අනුව දෙවියන්වහන්සේගේ ප්‍රඥාව පිරිසිදුය. එනම් ඇදහිල්ල කරණකොටගෙන ඒ ප්‍රඥාව දේව දරුවා තුල ජනිත වෙයි. එබැවින් ඇදහිලිවන්තයා ප්‍රඥාවෙන් ක්‍රියා කරයි. එම ප්‍රඥාව අන් අයට හානියක් නොකරයි. තම ජීවිතයත් පවුලත් සැලසුම් සහගතව මෙහෙයවයි. අන් අයගේ හිත සුව පිණිස හැම විටම ක්‍රියා කරයි. පිරිසිදුව සෘජුව ක්‍රියා කරයි. තව කෙනෙකු නොරවටයි. හැම විටම දෙවියන්වහනසේගේ ගෞරවය සඳහා ක්‍රියා කරයි. දෙවියන්වහන්සේ කෙරෙහි අදහන්නා ඥාණවන්ත ලෙස ක්‍රියා කරයි.

### 6. ඇදහිල්ල යටහත්පහත්කම (නිහතමානබව) උපදවයි
### (යාකොබ් 4 :1-12 ඉවසිල්ලෙන් කියවන්න)

යේසුස්වහන්සේගේ චරිතය දෙස බැලීමේදි කැපීපෙනෙන ලක්ෂණයක් වන්නේ දෙවියන්වහන්සේට යටහත් පහත් කමින් ක්‍රියා කල අකාරයයි. තම එකම බලාපොරොත්තුව දෙවියන්වහන්සේ බවට පත් වු විට ඒ ඇදහිල්ල කරණකොටගෙන නිහතමානීභාවය උපදියි. අදහන්නා යටහත්පහත් අයකු ලෙස කැපී පෙනෙයි.

### 7. ඇදහිල්ල දෙවියන්වහන්සේ මතම යැපීම උපදවයි.

ස්වාමීන්වහන්සේ කැමති සේක් නම්...... යන ප්‍රකාශය මෙහි සඳහන් කරමින් ජීවිතය පිළිබඳ මහත් යථාර්තවාදී එහෙත් අමාරු සත්‍යයක් අපට උගන්වයි. එනම් සියල්ලේදී දෙවියන්වහන්සේ කැමැත්ත අනුවම ක්‍රියා කල යුතු බව. දීර්ඝකාලීන හා කෙටිකාලීන සැලසුම් අපගේ ජිවිතයේ අපට තිබේ. ගමන් බිමන් හා සේවයන් වැනි බොහෝ වැඩ තිබුණත් ඒ සියල්ල කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්තද යන්න විමසා බලා ක්‍රියා කිරීම අති වැදගත්ය. දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල හැම විටම සියලු කාරණා වලදි දෙවියන්වහන්සේගේ අදහස අනුව තීරණ ගැනීමට හා උන්වහන්සේ මත යැපීමට පොළඹවයි.

ඔබත් දෙවියන්වහන්සේ හා යේසුස් ක්‍රිසතුස්වහන්සේ පමණක් විශ්වාස කරන්න. එවිට ඇදල්ලේ ගති ලක්ෂණ ඔබගේ ජීවිතයේත් පෙන්නුම් කරනු ඇත.

**එස්. මෙත්තානන්ද**
**සංස්කාරක**
0778813197

# අලුත් වෙනසක්

**මාර්ක් 5 : 1- 20**

සෙනෙහෙවන්ත සහෝදර සහෝදරියනි, ශුද්ධ බයිබලයේ අලුත් ගිවිසුම තුල අපට මුණගැසෙන ගෙරසේනයේ නම් රටේ යක්ෂාවේශ වූ මිනිසා ගැන අප කවුරුත් අසා කියවා ඇත්තෙමු. ඔහු පිළිබඳ ( මතෙව් 8 : 28 -34) දක්වාද, ( ලූක් 8 : 26 - 39 ) දක්වාද, ( මාර්ක් 5 : 1 -20) දක්වාත් සඳහන් වේ. මෙම සිද්ධිය පිළිබඳව සඳහන් කරන මතෙව් තුමා යක්ෂයන් දෙදෙනෙකු පිළිබඳව සඳහන් කරයි ( මතෙව් 8 : 28 ). මාර්ක් තුමා ඒ දෙදෙනාගෙන් එක් අයෙකු පිළිබඳව සඳහන් කරයි. ( මතෙව් 5 : 1 - 20 ) බලන්න. කෙසේ හෝ මෙයින් අපට පෙන්වන්නේ යක්ෂයාගේ දැඩි ග්‍රහනයට හසු වී සිටියා වූ මිනිසෙකුගේ ඉතා දුක්ඛිත ජීවිතයක්, ජීවනදායකයාණන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඉදිරියේදී වෙනස්වන කතා පුවතකි ( මාර්ක් 5 : 2 ). ඔහු සොහොන් ගෙවල් වල වාසය කල බව කියයි. දම්වැල් වලින් බැඳ විලංගු දමා සිටිමුත් එයින් ඔහුව කිසිවකුට නවතාලීමට නොහැකි වූ බව තව දුරටත් කියයි. මෙයින් අපට පෙන්වන්නේ යේසුස්වහන්සේ නොමැති සෑම ජීවිතයක්ම මේ ආකාර බවය. නිතරම තමා සිටින පාපිෂ්ඨ තත්වය ඔහුගෙන් හෝ ඇයගෙන් වසන් කරලීමට සාතන් වහා ක්‍රියාත්මක වනු ඇත. උන්වහන්සේ තම ජීවිතයේ නැති ඕනෑම කෙනෙකුගේ ජීවිතය ගමන් කරන්නේ නුසුදුසු තැන්වල බව ඔහුගෙන් පෙනේ. ඔවුන් සදාකාල ජීවිතය එපා කරමින් සත්‍යය බැහැර කර ජීවත් වන්නට ආශා ඇත්තෝය. යේසුස්වහන්සේ නොමැති සෑම සිතක් තුලම නිතරම ක්‍රියා කරනුයේ සාතන්ය. ඔහු නිතරම ශුද්ධාත්මයාණන්ට ඉතා විරුද්ධව නපුරුව ක්‍රියා කරයි. එපමණක් නොව ඔවුන් තමාටම හානියක් කර ගන්නා බව ඔවුන් නොදනියි ( මාර්ක් 5 : 5 ). ඔහු නොයෙකුත් ක්‍රියාකාරකම් වල යෙදෙමින් සිටි බව කියයි. ස්වාමීවූ යේසුස්වහන්සේ මුණගැසීමට පෙර අපද මෙලෙස සිටි බවද, සත්‍යයකි. සමාජයේ නොයෙකුත් පාපිෂ්ඨ ක්‍රියා වලට ඇලී ගෙන අන් අයට හිරිහැරයක්ව සිටි අපවද ස්වාමීන්වහන්සේ ඒ සියල්ලම අපගෙන් ඉවතලා තමන්වහන්සේගේ පුත්‍රයකු කරගත් දෙවියන්වහන්සේට අප දිවි හිමියෙන්ම ස්තුතිවන්ත විය යුතු වෙමු. අපවද යක්ෂයාගෙන් ගැලෙව්වේ උන්වහන්සේමය. මෙම යක්ෂාවේශව සිටි මිනිසාව ගැලවූයේද යේසුස්වහන්සේ බව මාර්ක් 5 : 12 - 13 පදවල පෙන්වයි. බලන්න , මිනිසා වර්ථමානයේ සහනය, ප්‍රීතිය, ගැලවීම සොයමින් නොයෙකුත් පුද පූජා වල සහ දාන මාන වල යෙදුනත් ඉන් පලක් නොවූ බව ඔවුන්ගේම වෙනත් ක්‍රියා වලින් පෙනෙන්නට තිබේ. සැබවින් මෙය මාර්ක් 5 : 3 කියන ආකාරය මෙම යක්ෂාවේශ වූ මිනිසාව අනෙකුත් මිනිසුන් විසින් දම්වැල් සහ විලංගු යොදා පාලනය කරන්නට හැදුවා බඳුය. මක්නිසාද මිනිසා ජන්මයෙන් ගෙනෙන පාපය නැතිකිරීමට දාන මාන වලට කිසිසේත්ම නොහැකි බව මිනිසා තේරුම් ගෙන ගැලවීම ලබා ගන්නා තාක්කල් ඔවුන් සිටිනුයේ ආත්මික මළ තත්වයේය ( රෝම 3 : 23 ). මිනිසා මෙම මළ තත්වයේ සැමදාම නොසිට පාපය හැර දමා යේසුස්වහන්සේගෙන් වූ නව උත්පාදනය ලැබ සදාකාල ජීවනයට ඇතුල්වනවා දැකීමට රිසි දෙවියන්වහන්සේ මිනිසාව පාපයෙන් ගැලවීමට තම එකම

පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව මෙලොවට දී වදාල සේක ( යොහාන් 3 : 16 ). (මාර්ක් 5 : 5) රෑ දහවල් මොර ගසමින් තමාගේ ශරීරය ගල් වලින් කපා ගනිමින් තමාටම හානි පමුණුවා ගනිමින් සොහොන් ගෙවල් වල සහ කඳු වල ජීවත් වූ මිනිසා පිළිබඳ ( මාර්ක් 5 : 15) අප දකින්නේ වෙනස් ආකාරයක චරිතයකි. ඉතා තැන්පත් සිහිකල්පනාව ඇති තම නග්න භාවය වසාගත් මිනිසෙකු බව පෙන්වයි. බලන්න, යේසුස්වහන්සේව මුණ ගැසීමට ප්‍රථම ඔහුගේ තත්වය ( මාර්ක් 5 : 5) සහ හමුවුනාට පසු ඔහුගේ තත්වය ද ( මාර්ක් 5 : 15) හි සඳහන් වේ. යේසුස්වහන්සේව මුණ ගැසීමට ප්‍රථම ගල් වලින් ඔහු තමාගේ ශරීරය ඉරා ගත් බව පවසයි. යේසුස්වහන්සේ නොමැතිව පාපයේ සිටීම තමාට කර ගන්නා විශාල හානියක් බව මිනිසුන් බොහෝ දෙනා නොදනියි. ඔහු ජීවිතයේ අධිපතියාණන් හමු වූ විගස යක්ෂයාගේ ග්‍රහණයෙන් මිදී සදාකාල රාජ්‍යයේ පුරවැසිකම ලබා ගනී. ඔහු සිහි ඇතිව වස්ත්‍රයක් පොරවාගෙන හිඳගෙන සිටී. අපද හරි සිහියෙන් හරි දේ තෝරා ගෙන ගැළවීමේ වස්ත්‍රය හැඳ උන්වහන්සේ තුල සිටිය යුතු වෙමු. එක තැනක නොරැඳී සෑම තැනම දිව් මිනිසා මේ වන විම ගලක් උඩ වාඩි වී තැන්පත්ව සිටියි. අපද ඔබ මොබ නොයා ස්වාමීන් තුල ස්ථිර වාම් ජීවිතයක් ගත කරන්නන් වීම අවශ්‍යය.

(මාර්ක් 5 : 6- 7) පදවල යක්ෂාවේශ වූ මිනිසා යේසුස්වහන්සේව දුරදීම දැක දුවගෙන ඇවිත් උන්වහන්සේට වැඳ ඉල්ලනුයේ තමාට වද නොදෙන මෙන්ය. මෙම කොටසේ ගැලවීම නොලද්දෙකුව යක්ෂයා අගේට මෙහෙය වන ආකාරය විග්‍රහ කරයි. මෙම ඉල්ලීම් කරනු ලැබුවේ මිනිසා නොව මිනිස් සිරුරට මුවා වූ යක්ෂයාය. මෙම තත්වය නැතිකොට සෑම මිනිස් ජීවිතයක්ම සාතන්ගේ ග්‍රහණයෙන් මුදාලීමට දෙවියන්වහන්සේ තම පුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේව එවූ බව (1 යොහාන් 3 : 8 ) ද කියයි. යක්ෂයාගේ ක්‍රියා පරාජය කල හැක්කේ උන්වහන්සේටම පමණී. එදා එම යක්ෂ ග්‍රහණයෙන් එම මිනිසා මුදවා ගත්තා සේම ඔබවද, මාවද පාපයෙන් ගලවා ගැනීමට ස්වාමිවූ යේසුස්වහන්සේ මඟ බලා සිටින සේක. උන්වහන්සේ ඔබගේ කැමැත්ත ලැබෙන තුරු එය ඔබ තුල සිදු කිරීමට උන්වහන්සේට නොහැක ( එළිදරව් 3 :20 ) බලන්න. ( මාර්ක් 5 : 16) යක්ෂාවේශ වූ මිනිසාට සිදුවූ දේ කුමක් දැයි බලනු පිණිස ඔහු වෙත දුව ආ ඌරු රැකවලුන් සිදුවූ සියල්ල දැක බියවී තමුන්ගේ සීමාවලින් ඉවත්ව යන මෙන් උන්වහන්සේගෙන් ඉල්ලුවෝය. ( මාර්ක් 5 : 17) බලන්න. ඌරු රැකවලුන් සැබවින්ම බැලුවේ ඌරන් රැළ මිස මේ තමා ඉදිරියේ සිටින ජීවනදායක යේසුස්වහන්සේ වෙත නොව, පොළොවේ කාරණාය. ඌරන්ගෙ න් පොළොවේ අපවිත්‍රත්වය පෙන්වයි. ඔව්හු නැවත වරක් යේසුස්වහන්සේ නිසා තමාට පාඩුවක් වෙයිදෝ සිතා එවැනි ඉල්ලීමක් ඉල්ලුවා වෙන්ට පුළුවන. ඔබත් මෙම ඌරු රැකවලුන් මෙන් පොළොවේ කාරණා බලමින්. ඒවා සලකමින් ජීවනදායක යේසුස්වහන්සේව ප්‍රතික්ෂේප කරමින් සිටී ද? උන්වහනස්සේ ඔරුවට නගද්දී යක්ෂාවේශ වූ මිනිසා උන්වහන්සේ සමඟ සිටීමට උදක්ම ඉල්ලා සිටියේය. ඔබත් ඔබගේ ජීවිතය නැමැති ඔරුවට උන්වහන්සේට නගින්නට ඉඩ හැර උන්වහන්සේ සමඟ නවතිමින් උන්වහන්සේ ගැන අන් අයට සාක්ෂි දරන්නෙකු වන්න ( මාර්ක් 5 : 20 )

**මතෙව් ප්‍රියංකර ෆොන්සේකා**

# මැවුම්කරුට නොව මැවිල්ලට භය මිනිසුන්

නිසල රැයකදී අහස් තලය දෙස ඔබත් බලා සිට තිබේද? වළාකුල් වලින් තොර නිල්වන් අහස දෙස බලා සිටින විට, එය සිත සනසන සිතුවිලි අවදි කරන චමත්කාරජනක දසුනකි. විවිධ ප්‍රමාණයේ තරු කැට අහස පුරා දිදුළයි. ඉමක් කොනක් සිතා ගන්න බැරි අහස් තලයෙහි දිදුළන තරු ගණන් කල නොහැක. පායා ඇති සඳ කිරි පාටින් බබළයි.

**අහස දෙවියන්වහන්සේගේ මහිමය ප්‍රකාශ කරයි. ගුවන්තලය උන්වහන්සේගේ හස්ත කර්මාන්තය දක්වයි (ගීතාවලිය 19 : 1).**

අහස පිළිබඳව දෙවියන්වහන්සේගේ පොත වන ශුද්ධ බයිබලයෙහි මෙසේ සඳහන් වේ. රාත්‍රියට අහසෙහි පෙනෙන මේ තරු මොනවාද? සමහර තාරකාවන් ග්‍රහලෝකවල්, සමහර තාරකාවන් අප දිනපතා දකින හිරු මෙන් සූර්යයන්ය. මෙය සූර්යග්‍රහ මණ්ඩලය ලෙස හඳුන්වයි. අපගේ සූර්යග්‍රහ මණ්ඩලයේ ඇත්තේ සූර්යා හා ග්‍රහ ලෝක නවයකි. මෙහි ඇති ග්‍රහ වස්තූන් ගණන්කල නොහැකිය. එහෙත් එකිනෙකට නියමිත ගමන් මාර්ග වල ඒවා ගමන් කරයි. කිසිදාක ඒවා එකිනෙකට ගැටෙන්නේ නැත. අප ජීවත් වන විශ්වයේ සෑම දෙයක්ම පුදුමාකාර ක්‍රමවත් සැලසුමක් අනුව ක්‍රියා කරන බව විශ්වයේ පැවැත්ම පිළිබඳව පර්යේෂණ කරන විද්‍යාඥයන් සාක්ෂි දරනු ඇත. එසේ නම් මෙම විශ්වය සැලසුම් කලේ කවුද? මෙම පුද්ගලයා පිළිබඳව ඔබ දන්නවාද? එසේ නැත්නම් ඉතාමත් සියුම්, ක්‍රමානුකූලව ක්‍රියා කරන මහා විශ්වය ඉබේ ඇති වුනා යැයි ඔබ විශ්වාස කරනවාද? පැරණි නුගත් මනුෂ්‍යයෝ සඳ දේවත්වයෙන් සලකා සඳට නමස්කාර කළෝය. එහෙත් ඇමරිකානුවන් විසින් සඳ මත පා තැබීමත් සමඟ සඳ පිළිබඳ තිබූ මිත්‍යා මත ටිකෙන් ටික වැලලී ගියේය. අද අප ජීවත්වන්නේ දැනුම පුපුරා ගිය තාක්ෂනයෙන් ඉතා මහත් දියුණුවක් ලබා ඇති ලෝකයකයි. විශේෂයෙන් සන්නිවේදන තාක්ෂණය මහත් පෙරලියක් කර තිබේ. එහෙත් තවමත් මිනිසුන් ග්‍රහ වස්තූන් කෙරෙහි විශ්වාසය තබා තම ජීවිතය එම ග්‍රහ වස්තූන් වලින් පාලනය වෙනවා යැයි විශ්වාස කරති. එහෙත් බයිබලයේ මෙසේ සඳහන් වේ. ''පටන් ගැන්මේදී දෙවියන්වහන්සේ අහසත් පොලොවත් මැවූ සේක''. එම සත්‍යය යටපත් කරන්නට පුළුවන් වූ කිසියම් ස්ථිර මතයක් තවම කිසිවකු විසින් ඉදිරිපත් කොට නැත. විවිධ මතයන් කාලයෙන් කාලයට පැන නැගී ක්‍රමානුකූලව යටපත් වේ. දෙවියන්වහන්සේ විසින් මේ විශ්වය මැවූ බව පිළිගන්නට මිනිසුන් අකමැතිය. එහෙත් එය පරම සත්‍යයකි. විශ්වයත් අප ජීවත්වන ලෝකයත් එහි ඇති පෙනෙන නොපෙනෙන සියල්ලත් දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේගේ බලය කරණකොට ගෙන මවන ලදී. දිය බිඳුවක් කුහුඹුවකු දකින්නේ මහා සාගරයක් මෙනි. ඒ ආකාරයෙන් විද්‍යාවෙන් ස්වල්පයක් තොල ගා ගත් නූතන පරපුර දෙවියන්වහන්සේ නැතැයි ප්‍රකාශ කරන විට මට අර කුහුඹුවා සිහියට නැගේ. සියල්ල පංච මහා භූතයන්ගෙන් ඇති වුනා යැයි සමහරු කියති. මහා පිපිරීම යන මතයෙහි බොහෝ දෙනා මුලා වෙති. චාල්ස් ඩාවින් නැමැති අමන උගතාගේ මතය හිසේ දරා ගෙන මිනිස් සංහතිය වඳුරාගෙන් පවතින බව කියති. වඳුරා බිහි වුනේ කෙසේදැයි මෙම ඊනියා විද්‍යාඥයන් දන්නේ නැත. සියල්ලටම ආරම්භයක් තිබිය යුතුය. මනුෂ්‍යය සංහතියටද ආරම්භයක් තිබිය යුතු නොවේද? සඳ තරණයේ යෙදුන ගගනගාමීන් දෙවියන්වහන්සේගේ මැවිල්ලේ අලංකාරය දුටුවෝය. අදටත් බොහෝ විද්‍යාඥයින් දෙවියන්වහන්සේගේ

මැවීමේ සංකල්පය පිළිගනී. රුසියානු ගගනගාමියෙකු වු යූරි ගගාරින් අභ්‍යවකාශ තරණයේදී තමා දෙවියන්වහන්සේ දුටුවේ නැතැයි නිගා කළේය. පසුව ඔහු අවාසනාවන්ත මරණයකට ගොදුරු විය.

**"ලෝකයද එහි ඇති සියල්ලද මැවූ දෙවියන්වහන්සේ ස්වර්ගයටත් පොළොවටත් ස්වාමිව සිටින සේක" (ක්‍රියා 17 : 24 ).**

මේ සත්‍යය ඥානයෙන් මුහුකුරා ගිය විද්‍යාඥයන් සැකයෙන් තොරව පිළිගන්න අතර තර්ක නොකර දෙවියන්වහන්සේගේ මැවිල්ල පිළිබඳව අලුත් තොරතුරු ගවේෂණය කරයි. ලෝකයේ තිබෙන දෙවියන්වහන්සේගේ නිර්මාණ අතරෙන් මිනිස් ශරීරය සුවිශේෂී ස්ථානයක් ගනී. ශරීර අභ්‍යන්තරයේ ක්‍රියාකාරීත්වය හා පැවැත්ම පිළිබඳව ඉගෙන ගන්නා විට ඔබ විමතියට පත් වෙනු ඇත. මනුෂ්‍යය ශරීරය පුදුමාකාර යන්ත්‍රයකි. ඉපදුන දවසේ සිට මිය යන තුරු අවුරුදු සැත්තෑවක් - අසූවක් නොනැවතී ක්‍රියා කරයි. ආහාර, ස්වසන, රුධිර, ස්නායු, ප්‍රජනන පද්ධතිවල ක්‍රියා කාරීත්වය තෙරම් සියුම්ද? මෙතෙක් එවැනි යන්ත්‍රයත් විද්‍යාඥයන්ට නිර්මාණය කිරීමට හෝ මැවීමට හැකිවී තිබේද? මිනිසා දෙවියන්වහන්සේගේ හස්ත කර්මාන්තයකි. ඒ ආකාරයෙන් මේ ලෝකයේ ජීවත් වන සියළුම ජීවීන් හා ස්වාභාවික පරිසරය දෙවියන්වහන්සේගේ පුදුම නිර්මාණයන්ය.

ඔබත් මමත් මවගේ කුස තුළදී දෙවියන්වහන්සේ විසින් ඉතාම සැලසුම් සහගතව ක්‍රමානුකූලව නිර්මාණය කරන ලද දෙවියන්වහන්සේගේම අත් වැඩයකි. බයිබලය මෙසේ පවසයි "මාගෙ ශරීර රූපය ඔබගෙන් (දෙවියන්වහන්සේගෙන්) සැඟවී නොතිබුනේය. ඔබගේ ඇස්වලට මාගේ ශරීර ධාතුව පෙනුණේය. ඔබගේ පොතෙහි මාගේ සියළුම අවයවයන් ලියන ලද්දේය. ඒවායින් එකක්වත් නැති කල්හි දවසින් දවස ඒවා සාදන ලද්දේය" (ගීතාවලිය 139: 15 - 16).

දෙවියන්වහන්සේගේ ජීවමාන බලය සහ මැවීම වටහා ගැනීමට අපගේ ශරීරය හොදම නිදසුනකි. ලොව පර්යේෂණකරන උගතුන් ලක්ෂ ගණනක් සිටී. එහෙත් ඔවුන් දැක දැකත් අස අසාත් දෙවියන්වහන්සේ දැක ගන්නට පිළිගන්නට නොහැකිව මං මුලාවී සිටිති. විද්‍යා දැනුමෙන් හා තාක්ෂණයෙන් හැම දෙයන්ම කල හැකි යැයි සිතන අය සිටිති. මරණය වැලැක්වීමට ක්‍රමයක් විද්‍යාවෙන් සොයාගෙන තිබේද? මිනිසා පාප බලයෙන් හා යක්ෂ බලයෙන් මුදවා ගැනීමට විද්‍යාඥයන් සොයාගෙන තිබෙන්නේ මොනවාද? තවමත් පිළිකා වැනි අසාධ්‍යය රෝග වලට නිශ්චිත ප්‍රතිකාරයක් සොයමින් පවතී. එසේනම් විද්‍යාඥයන්ගේ සේවය බවට පත්වී ඇත්තේ දැනටමත් තිබෙනදේ සොයාගැනීමයි. විද්‍යාවෙන් මිනිසාගේ මරණය, පාපය, සදාකාලය, අසහනය වැනි ප්‍රධාන ප්‍රශ්ණ වලට පිළිතුරු ලැබී නැත.

දෙවියන්වහන්සේගේ වැඩ සිටීම හා බලය ඇදහිල්ලෙන් විශ්වාස කිරීම මගින් මරණය, පාපය, අසහනය සදාකාලය , යන ප්‍රධාන ගැටළු වලට පිළිතුරු සපයා ගත හැක. උන්වහන්සේගේ පොත වන ශුද්ධ බයිබලය විද්‍යාව පිළිබඳ පොතක් නොවුනත් මේ විශ්වයේ සහ මනුෂ්‍යය සංහතියේ ආරම්භයේ සිට අවසානය දක්වා සියළු තොරතුරු සඳහන් වේ. මනුෂ්‍යාගේ ජීවිතයේ යථාර්ථය හා අභිප්‍රාය එම පොතෙහි දෙවියන්වහන්සේ පැහැදිලිව සඳහන් කර ඇත. මනුෂ්‍යා කෙරෙහි මේ විශ්වය අයිති දෙවියන්වහන්සේගේ ආදරය, කරුණාව, මේ පොතෙහි ලියා ඇත. ඔබ කුමන ආගමකට, ජාතියකට, අයිති වුවත් බයිබලයක් ලබා ගෙන විවෘත මනසකින් යුතුව කියවන්නට ආරම්භ කරන්න. එවිට ඔබ විද්‍යාඥයකුට වඩා ඥානවන්ත වේ. දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා.

**ගුරුහරු**

# බල්ලන්ගෙන් ප්‍රවේශම් වන්න

ඉහත දැක්වෙන පාඨය රැගත් ලෑලි පුවරු ඔබ ඕනෑ තරම් දැක ඇතුවාට කිසිම සැකයක් නැහැ. ලොකු ගෙවල් වලට ඇතුල් වන ගේට්ටුවල මෙය නොවරදවාම දකින්නට පුළුවනි. ඔබට හිතෙන්නට පුළුවන් ඇයි මේ වගෙ පාඨයක් ක්‍රිස්තියානි සඟරාවක පල කලේ කියලා. මට කියන්නට තිබෙන්නේ ඒ මැය මම නොව පාවුල් තුමා ලියූ වගයි. කොතැනද ඒ පදය තිබෙන්නේ? ඇත්තටම එහෙම පදයක් තිබෙනවාද? ඔව් ! තිබෙනවා ! මම පද අංකය පස්සෙ කියල දෙන්නම්. පුළුවන්නම් මතක් කරලා පෙරලලා හොයා ගන්න. ඒ විතරක් නොවෙයි බල්ලා ගැන පද මල්ලක්ම දේව වචනයේ තිබෙන අතර එවා සොයා ගැනිමට උත්සහ කිරීමෙන් ඔබගේ බයිබල් දැනුම වැඩි කර ගත හැක.

මිදියොන්වරුන්ගෙ සටන් වලින් හෙම්බත් වී සිටි ඊශ්‍රායෙල් ජනතාව ගිඩියොන් නම් දේව දරුවා සමඟ යළි සංවිධානය විය. ගණනින් තිස් දෙදහසක් වූ ඔවුන් අතරින් ජයග්‍රහණය සඳහා සටනට ගියේ තුන්සිය දෙනෙකු තරම් සුළු පිරිසක්ය. ගිඩියොන් ඔවුන් තෝරා ගත්තේ ඔයක් අසලට ගෙනැවිත් දිය බීමට සැලැස්වීමෙනුයි. පිරිසක් දෑතින් ගෙන දිය බිව්වා ,පිරිසක් බල්ලන් මෙන් ඉවුරේ දිගා වී ලෙවකා දිය බිව්වා. බල්ලන් මෙන් යටහත් වූ එම තුන්සිය දෙනා තමයි ලක්ෂ ගණනක් වූ එම මිදියන් සේනාව පරාජය කලේ. ඔබටත් එවැනි යටහත් කිතුණු ජීවිතයක් තිබෙනවාද? විනිශ්චයකාරයන්ගේ පොතේ 7 : 5-6 පද කියවන්න. යටත්කම නැතිනම් ඔබ ජය ගන්නේ නැහැ. ඔබේ ශක්තිය විසින් ඔබ අතරමං කරාවි. බල්ලෙකු මෙන් කීකරු කම වැදගත්ය.

**<u>යටහත් චරිතය</u>**

1 සාමුවෙල් 17 : 43 හි හමුවන පිලිස්ති යෝධයා වන ගොලියත් විසින් දාවිත් නම් කුඩා වීරයාට අපවාද නගමින් "තෝ සැරයටිය රැගෙන මා වෙතට එන්නේ මම බල්ලෙක්ද?" යි කී සැටි අපි දනිමු. ඇත්තටම ගොලියත් යෝධ සිරුරක් දැරූ මිනිසුන් අතර සිටි බල්ලෙක් බව ඔහුගේ වචන වලින්ම පෙනෙයි. ඔහු දාවිත්ගේ මස් ආකාශ පක්ෂීන්ට දෙන බව කියමින් අපහාස කලා නොවේද? අප අතර පවා තමාගේ පාරට්ටුව මත අන් අයට ( අසරණ, දුර්වල හෝ අහිංසක අයට) නින්දා කරන නාමික ඇදහිලිවතුන් සිටීනම් ඔවුන්ට ගොලියත්ගේ බලු සිත බද්ධවී ඇතුවාට සැකයක් නැත. 1 සාමුවෙල් 24 : 14 හි දාවිත් තමාව මළ බල්ලෙකු සේ හඳුන්වා දෙන ආකාරය වැදගත්. බලන්න ඔහු රජු ඉදිරියේ නිහතමානීව .මා නොවටිනා මිනිසෙකු ලෙස ඒත්තු ගන්නා ආකාරය. එහෙත් කෝපවූ යුද්ධ දක්ෂ අබ්නේර් ආඩම්බරව "මම යූදාගේ බලු හිසක්දැයි" ( 2 සාමුවෙල් 3 : 8 ) ප්‍රශ්ණ කරන ආකාරය අපේද සැඟවුණ ආඩම්බරය එළිදරව් කරයි. ඔබට ඔබ ගැනම ප්‍රමාණයට වඩා පාරට්ටුවක් තිබෙනවා නම් අබ්නේර් මෙන් බොරු අහංකාරකම නැමැති අංතට්ටුව ඔබත් පැළඳ ගෙනයි ඉන්නෙ! පරිස්සමින් ඒක ගලවා දමන්න. දාවිත් රජ වූවාට පසුව තමාට සතුරුකම් කල සාවුල්ගේ පුත්‍රයා හමුවූ විට කල දේ ඔබ දන්නවාද? අබ්බගාත තරුණයෙක් වූ ඔහුට දාවිත් තම මංගල මේසයෙහි නිරතුරුවම කෑම දුන් බවත් සාවුල්ගේ වරද ගැන මෙපිබොෂෙත් නම් ඒ අබ්බගාත තරුණයාට දඬුවම් නුදුන් බවත් තේරුම් ගන්න. ඒ නිසා

තමයි මෙපිබොෂෙත් මෙවැනි ප්‍රකාශයක් 2 සාමුවෙල් 9 : 8 කළේ ''ඔබ විසින් මා වැනි බල්ලකු සැලකීමට ඔබගේ මෙහෙකරුවා කව්ද?'' මෙපිබොෂෙත්ගේ තමාවම යටහත් කර ගැනීමේ ස්වභාවය නිසා ජීවිතයත් බේරාගෙන රාජ මංගල්‍යය මේසයේ කෑමත් ලැබුණා. ''බල්ලා'' යන මේ පද වලින් අපට යටහත්කම මුලින්ම උගත හැක.

**මුර බල්ලා සහ පිස්සු බල්ලා**

බල්ලා බොහෝ විට මුරකරුවෙක්. සුරතලෙක්. ඌ කොපමණ ආදරය ලබනවාද? නිවස ආරක්ෂා කරමින් විශාල සේවයක් කරනවාද? එහෙත් වූ පිස්සු වැටුණු විට මේ යහ ගුණ වහාම මැකී යන හැටි අපට දකින්න පුළුවන්. ඌ ඊලඟට කරන්නේ භයානක විනාශයක්. මෙබඳු ජීවිත දරුණ කී දෙනෙක් මේ මිනිස් සමාජයේ සිටීද? කෑම දුන් අත සපාකන බල්ලන් බඳු මිනිසුන් අප අතර විරලද?

බල්ලා බොහෝ විට දුර දිග නොබලයි. බුරන්නන් වාලේ බුරයි. ගීතාවලිය 22 : 30 යාච්සදාව මතකයට ගනිමු. මාගේ ප්‍රිය ප්‍රාණය බල්ලාගෙන් මිදුව මැනවයි'' දාවිත් කියයි. අනුන්ගේ කාරණාවලට මැදිවී අනවශ්‍යය කරදර වලට පටලැවී එනිසාම තමුන්ගේ ඇඳහිල්ලද නැති කරගන්නා අය ඕනෑ තරම්ය. හිතෝපදේශ 26 : 17 මේ පිළබඳව දෙන උපමාවට මූලිකව සිටින්නෙත් බල්ලාමයි. ''පාරේ යමින් තමාට වැදගැන්මක් නැති දබරයකට මැදිවෙන්නා, උගේ කන් වලින් බල්ලෙකු අල්ලා ගන්නා මනුෂ්‍යයකු මෙන්ය.'' ඔබ මෙවැනි අනවශ්‍යය ඕපා දූප වලට මැදි වෙන හැම දේටම කතා කරන දේව දරුවෙක් නම් හපාකන බල්ලාගේ දෙකනින් අල්ලා ගෙන සිටින්නේ ඔබමයි. බේරීමට අවශ්‍යය නම් ප්‍රවේශමින් අත්හරින්න. ඔබ ළඟ ඇති ශුද්ධ දේ බල්ලන්ට නොදෙන්න යැයි යේසුස්වහන්සේම ( මතෙව් 7 : 6 ) කී සේක. අනවශ්‍යය තර්ක, ධර්ම බේද ඉවත ලන්න. බොරු විතර්ක එපා කරන්න. ''බල්ලෝ පවා ඉවතලූ මේසයේ කෑම අහුලා කති''යැයි (මතෙව් 27: 15 ) හි ලියා තිබෙන නිසා යාච්ඥාව බලවත් වූ විට තර්ක දහසකින් කරන දේට වඩා බලවත් යමක් දෙවියන්වහන්සේ ලවා අඳුරේ සිටින්නන්ට කරන්නට පිළිවනි. ඔච්චුද ගැලවීම ලැබීමට ඕනෑතරම් ඉඩ තිබේ.

හිතෝපදේශ 26 : 11 හා 2 පේත්‍රුස් 2 : 22 හි ලියවී ඇත්තේ එකම පදයයි. ''බල්ලා උගේ වමනයට හැරී ගියේය''. පළමු පව් වලින් මිදී ගැලවීම ලැබ අළුත් උත්පාදනයේ රස බලා නැවත රූප වන්දනා, පූජක චාරිත්‍ර, බීමත්කම්, මංගල්‍යය ඝෝෂා වැනි වැනි දේ පසුපස යන්නන්ගේ තත්වයයි මේ. වමනය කර ඉවත හැරී යෑම යහපත් වුවත් නැවත හැරී ඒවා කෑමට හොස්ස පෙවීම දේව දරුවකුට කිසිසේත් අයිති නැත. එබඳු දේ කරන ''බල්ලන්'' ගේ ගතිගුණ ඇත්තවුන් ස්වර්ගය නොදකින බව එළිදරව් 22 :15 දක්වා තිබෙනවා. ඒ නිසා තමයි මෙබඳු ''බල්ලන්ගෙන් ප්‍රවේශම් වන්නැයි'' පාවුල් තුමා පිලිප්පි 3 : 2 ලියන්නේ. වමනය නැවත කා අන් අයටත් වමනය කැවීමට උත්සහ දරණ බල්ලන් ගෙන් ප්‍රවේශම් වීම අත්‍යාවශ්‍යය දෙයක්. එසේ වූ තැන බල්ලාට බිය වීමට හේතුවන් නැහැ. සමහර විට බල්ලාගෙන් සාතන්වද සංඛේත වන බව තේරුම් ගන්න.

**ප්‍රන්සිස් විජයසිංහ**
**(පැරණි සඟරාවකින් උපුටා ගන්නා ලදී)**

# සභාව ගොඩ නැගී ඇති පර්වතය කුමක්ද?

"නුඹ පේතෘස්ය, තවද මේ පර්වතය පිට මාගේ සභාව ගොඩ නගමි" (මතෙව් 16 : 18 ). මෙම වචන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් පේතෘස්ට පැවසූ සේක. මෙම වචනය අලලා වැරදි ඉගැන්වීමක් බිහිවී ඇත. එනම් පේතෘස් පිට සභාව ගොඩ නැගී ඇති බවට. නමුත් උන්වහන්සේ එසේ පැවසුවේ හෝ අදහස් කලේ නැත. "නුඹ පේතෘස්ය"- එනම් "පෙට්රොස්" කුඩා ගලක්ය. නමුත් මේ පර්වතය පිට "පෙට්රා" (ග්‍රීක් වචනය) මත සභාව ගොඩ නගන බවය. එනම් කුඩා ගල මත නොව මහා පර්වතය පිට සභාව ගොඩ නගන බවය. එනම් මෙහි පෙට්රා නොහොත් මහා පර්වතය ක්‍රිස්තුස්වහන්සේය. එමෙන්ම මෙහි පෙට්රොස් නොහොත් කුඩා ගල් කැටය නම් පේතෘස්ය. සභාව ගොඩනැගී ඇත්තේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මතය. මෙම වැරදි මතය සභාවට මහත් පාඩුවකි. මෙය නිවැරදි කර ගැනීම අපගේ ඇදහිල්ලට මහත් ප්‍රයෝජනයත්ය.

පසුව පේතෘස් තමාගේ පළමු යැවුම් පත්‍රයෙහි, 1 ප්‍රේතෘස් 2 : 5-8 දක්වා කොටසෙහි සියළු ඇදහිලිවන්තයින් ගල්වලටද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ප්‍රධාන පර්වතයකටද සමාන කරමින් විග්‍රහ කරයි.

පාවුල් තුමාද මෙම සත්‍යය මනාවට පිළිඹිබු කරමින් මෙසේ ලියයි. "ඒ පර්වතය නම් ක්‍රිස්තුස්වහන්සේය" (1 කොරින්ති 10 : 4 ). තවද එපීස 2 : 19 -21 පද කියවා බැලීමෙන් කොනේ ප්‍රධාන ගල ලෙස යේසුස්වහන්සේව හඳුන්වා දෙයි. 1 කොරින්ති 3 : 11 යේසුස්වහන්සේ සභාවේ අත්තිවාරම ලෙස ප්‍රකාශ කරයි. තවද එම අත්තිවාරම මත සභාව ගොඩනගන බවට ඔහු ස්ථිරව ප්‍රකාශ කරයි. පැහැදිලිව දේව වචනය අපට පෙන්වා දෙන්නේ දෙවියන්වහන්සේගේ අදහසයි. ඒ අනුව සභාව ගොඩනැගී ඇත්තේ ඒ මහා පර්වතය වන ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මතය.

මතෙව් 16 : 19 හි ස්වර්ග රාජ්‍යයේ යතුරු පේතෘස්ට දුන් බව සඳහන් වේ. එනම් සභාවේ යතුරු නොව ස්වර්ග යේ යතුරු පමණයි. මෙහි අදහස නම් මිනිසුන් සුභාරංචිය කරණකොටගෙන ස්වර්ගයට ඇතුල කිරීමේ බලයය. මතෙව් 18 : 18ට අනුව මෙම බලය සියළු ඇදහිලිවන්තයන් සතුය. එනම් නිරයෙන් ගලවා මිනිසුන් ස්වර්ගයට ඇතුල් කිරීමේ බලයයි. නොහොත් යතුරයි. දේව වචනය නිවැරදිව අවබෝධ කර ගැනීමට හා ශුභාරංචිය ප්‍රකාශ කිරීමට දෙවියන්වහන්සේගේ මහත් කරුණා අනුග්‍රහය ඔබ සමඟ වේවා.

**ගුරු හරු**

# ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැන ගත නොහැකි සම්පත

කිතුණු ආභාෂයක් ඇති ඕනෑම කෙනෙකු ශුද්ධ බයිබලයෙහි සඳහන් අකීකරු පුත්‍රයාගේ උපමා කථාව දැන සිටිනවාට සැකයක් නැත. එය ලූක් 15 වැනි පරිච්ඡේදයේ සඳහන්ව තිබේ. අකීකරු පුතා යනුවෙන් නමක් පට බැඳුනේ එම කතාවේ එන බාල පුත්‍රයාට වුවත් එම කතාවේම එන වැඩිමහල් පුතා ගැනත් එහි සඳහන් වන්නේ පැසසිය හැකි වාර්ථාවක් නොවේ. පියාගේ වස්තු සම්පත් තමාට උරුමව තිබියදීත් හෙතෙම දුප්පතෙකු ලෙස ජීවත් වූ ආකාරය පෙනෙන්නට තිබේ. ඇත්තෙන්ම යේසුස්වහන්සේ එම උපමා කතාවෙහි උපහැරණයට ගන්නේ වැඩිමහල් පුතාගේ මෙම කණගාටුදායක තත්වයයි. එවකට සිටි ඵරිසිවරු සහ ලියන්නන් වැනි ආගමික මිනිසුන් වැඩිමහල් පුතාගේ චරිතයෙන් යේසුස්වහන්සේ විසින් උපමා කරන ලදී. පව් ගැන පසුතැවී ආපසු හැරී දෙවියන්වහන්සේ වෙත එන පව්කරුවන් පිළිගැනීමට ඵරිසිවරු හෝ ලියන්නන් වැනි ආගමික පුද්ගලයින් කැමති වූයේ නැත. ඔවුන්ගේ ආත්මික දුගී භාවය ඉන් මොනවට පැහැදිලි වේ. යේසුස්වහන්සේ වැඩිමහල් පුතා ගැන උපමාව කීවේ ඔවුන් උදෙසාමය. ලූක් 15 : 12 ට අනුව පියාගේ සම්පතින් කොටසක් තමාට ලැබී තිබියදීත් වැඩිමහල් පුතා හැසිරුනේ දුගියෙකු ලෙසයි. ''එළු පැටවකු වත් ඔබ මට නුදුන්නෙහි''යයි වැඩිමහල් පුතා චෝදනා කලේය. කිතුණු අපිත් බොහෝවිට මීට සමාන වේ.

යේසුස්වහන්සේ අදහා ගැලවීම ලැබුවෝ ආත්මික ලෙස පොහොසත් වූවෝය. අපට **''ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැන ගත නොහැකි සම්පත උරුම කර දී තිබේ'' ( එපීස 3 : 8 ).** ''අකීකරු පුතුන් දෙදෙනාගේ උපමාව'' මැයින් පසුගිය සඟරාවේ පළවූ ලිපියේ දෙවැනි කොටසක් ලෙස ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැනගත නොහැකි සම්පත පිළිබඳව දැන් සාකච්ඡා කරමු.

**<u>ඔබට උරුම සම්පත</u>**

**''සියළු ශුද්ධවන්තයන්ගෙන් ඉතා කුඩා තැනැත්තාවූ මට මේ අනුග්‍රහය දෙන ලද්දේ ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැනගත නොහැකි සම්පත ගැන අන්‍යය ජාතීන්ට දේශණා කරන්නටයි'' ( එපීස 3 : 8 ).** පාවුල් තුමා නගරයෙන් නගරයට ගොස් අන්‍යය ජාතික සහ අන්‍යය ආගමික මිනිසුන්ට දේශණා කලේ ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාකොට ගෙන පව්කමාව ලැබීම ගැන පමණක් නොවේ. පව්කමාව ලබා ගැලවීම අත්දකින අයට උරුම වී ඇති ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැනගත නොහැකි සම්පත ගැනද මොහු කතා කර තිබේ. මේ සම්පත කුමක්දැයි අප දැන් සොයා බැලමු.

යේසුස්ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිලිවන්තයෙකු හැටියට ස්වර්ගීක වූ ආත්මික වින්දනයක් ලැබීම අපට උරුම වූ දෙයකි. ප්‍රේමය, ප්‍රීතිය සහ සමාදනය වැනි දෑ මහ ඉහලින්ම භුක්ති වීදීමට ඇදහිලිවන්තයෙකුට උරුමය. පහත සඳහන් සම්පත් ලැයිස්තුව සලකා බලන්න.

1 - කිසි නුවණකින් දැන ගත නොහැකි වූ දෙවියන්වහන්සේගේ සමාදානය - පිලිප්පි 4 : 7
2 - ක්‍රිස්තුස්වහන්සේගේ දැන ගත නොහැකි ප්‍රේමය, - එපීස 3 : 18

3 - කියා නිමකල නොහැකිවූ තේජසින් පූර්ණවූ මහත් ප්‍රීතිය - 1 පේතෲස් 1 : 9
4 - තේජසේ බලාපොරොත්තුව - කොලොස්සි 1 : 27
5 - රනට වඩා අගේව තිබෙන ඇදහිල්ල - 1 පේතෲස් 1 : 7
6 - දෙවියන්වහන්සේගේ දරුවන්ගේ මහිමාන්විත නිදහස්කම - රෝම 8 : 21
7 - යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීමේ බලය - එපීස 1 : 19-20

ඉහත සඳහන් සම්පත් උපරිම අයුරින් භුක්ති විඳීම ඇදහිලිවන්ත අපගේ උරුමයයි. ඒවා යේසුස්වහන්සේ විසින් ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොට ගෙන අපට දායාද කර තිබෙන දේය. තම පියාගේ ගෙදරම ජීවත් වෙමින් පියාගේ උරුමය භුක්ති නොවිඳ දුගී ලෙස හැසිරුණු, තම මිතුරන් සමග ප්‍රීති වීමට එළු පැටවකුවත් නැතුව සිටි වැඩිමහල් පුතා මෙන් නොවෙමු.

## 1. කිසි නුවණකින් දැන ගත නොහැකි වූ දෙවියන්වහන්සේගේ සමාදානය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහාගත් වහාම අප සතු වන මහඟු සම්පතක් තමා සමාදානය. එය දෙවියන්වහන්සේ විසින් අපගේ හදවතට වගුරු වන අපූරු අත්දැකීමකි. එසේ අප අත්දකින සමාදානයට හේතුවනම් පාපයට කමාව ලැබීමයි. පාපයේ දඬුවම වන නිරයට යෑමේ අවිනිශ්චිත භාවය දුරුවී යෑමයි. සමාදානය දෙආකාරයි. දෙවියන්වහන්සේ හා සමඟ සමාදානය සහ දෙවියන්වහන්සේගේ සමාදානය භුක්ති විඳීම යනු ඒ දෙආකාරයයි. දෙවියන්වහන්සේගේ සමාදානය භුක්ති විඳීමට නම් දෙවියන්වහන්සේ හා සමාදානය පළමුවෙන් සහතික විය යුතුය. ඇයි අපි උපතින්ම දෙවියන්වහන්සේගේ සතුරෝද? ඔව් තත්වය එසේය,

අපගේ පාප හේතුකොට ගෙන අප දෙවියන්වහන්සේගේ සතුරන් වී සිටින බව බයිබලය සඳහන් කරයි. එහෙත් දෙවියන්වහන්සේ තම ප්‍රේමය හේතුවෙන් මේ සතුරුකම බිඳ හෙළීමට තම පුත්‍රයාණන් කරණකොටගෙන සැලසුමක් සපයා තිබේ. **"මක්නිසාද අප සතුරන්ව සිටියදීම දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ මරණය කරණකොටගෙන උන්වහන්සේ සමග අපි සමගි කරනු ලැබුවෙමු නම්, සමගි වුනාවූ අපි ඊටත් වඩා උන්වහන්සේගේ ජීවනය කරණකොටගෙන ගළවනු ලබන්නෙමුව" (රෝම 5 : 10).** ස්වාමී වූ යේසුස්වහන්සේ කුරුසිය මත එල්ලී සිටි විට කලේ මේ දෙයයි. උන්වහන්සේ මිනිසාගේ පව්කාර අතද දෙවියන්වහන්සේගේ ශුද්ධවූ අතද ගෙන එකට එකතු කල සේක. ඔබට සමාදානය, ශාන්තිය හිඟ නම් ඔබගේ ප්‍රමුඛ අවශ්‍යයතාවය වනුයේ දෙවියන්වහන්සේ සමඟ සමාදානය පිහිටුවා ගැනීමයි. ඔබ කල යුත්තේ දෙවියන්වහන්සේ ඉදිරිපිට පව්කරුවකු බව පිළිගෙන ස්වාමී වූ යේසුස්වහන්සේ ඔබගේ ගැලවුම්කරුවා සහ ස්වාමීන්වහන්සේ ලෙස පිළිග ැනීමයි. එයාකාරයෙන් දෙවියන්වහන්සේ සමඟ සමාදානය පිහිටුවා ගත්විට දෙවියන්වහන්සේගේ සමාදානය ඔබ හදවතෙහි අත්දැකීමට හැකි වනු ඇත. ස්වාමීවූ යේසුස්වහන්සේගේ කැමැත්ත නම් අප හදවතේ පූර්ණ සමාදානය ඇතුව සිටීමයි.

## ඇදහිලිවන්තයන් ලෙස අපට අත්දැකිය හැකි සත්ප්‍රකාර සමාදානය

දෙවියන්වහන්සේගේ සත් ප්‍රකාර වූ සමාදානය පිළිබඳව බයිබලය අපට කතා කරයි. මේවා සමාදානයේ සත්ප්‍රකාර පරීක්ෂණය ලෙසද නම් කල හැක. මෙවැනි ආකාර සමාදානයක් ඔබට තිබේ දැයි සෝදිසි කර බලන්න.

**1. ශාන්ත සමාදානය**

**"ඔබ කෙරෙහි සිත තබා සිටින තැනැත්තා, ඔබ කෙරෙහි විශ්වාස කරන බැවින්, ඔබ ඔහු ශාන්ත සමාදානයෙන් ආරක්ෂා කරන සේක"( යෙසායා 26 : 3 ).**

ශාන්ත සමාදානය යන වචන වෙනුවට "සමාදානය සමාදානය" ලෙසද පරිවර්ථනය කර තිබේ. දෙවියන්වහන්සේ අපට දෙන්නට කැමති වන්නේ එවැනි සමාදානයකුයි. එය නිතර පවතින සමාදානයකි. එය අප වෙත පැමිණෙන්නේ පාප කමාව සහ සදාකාල ජීවනය පිළිබඳ වන ස්ථිරත්වය තුලින්ය. ඔබගේ සිත ස්වාමීවූ යේසුස්වහන්සේ වෙත යොමුකර තබන්න. එවිට දෙවියන්වහන්සේ ඔබට ශාන්ත සමාදානය දෙනසේක.

**2. මහත් සමාදානය**

**"ඔබගේ ව්‍යවස්ථාවට ප්‍රේම කරන්නන්ට මහත් සමාදානයක් ඇත: පැකිලීමට කිසිවක්ද ඔවුන්ට නැත්තේය"(ගීතාවලිය 119 : 165 ).**

මෙම පදය අපට කතා කරන්නේ දෙවියන්වහන්සේගේ වචනය කියැවීම කරණකොටගෙන අප ලබන සමාදානය ගැනයි. ඔබ දෙවියන්වහන්සේගේ වචනයට ප්‍රේම කරන්නේ යැයි අවංකව කිව හැකිද? දිවා රෑ දෙකෙහි දෙවියන්වහන්සේගේ වචනය මෙනෙහි කරන්නාවූ මනුෂ්‍යයාගේ ආශිර්වාදය ගීතාවලිය පළමු පරිච්ජේදයෙහි දෙවියන්වහන්සේ අපට කතා කරන සේක. දවල් හීන දැකීමේ පාපයෙන් ඇදහිලිවන්තයන් ජය ගත යුතුය. ඒ වෙනුවට දේව වචනය මෙනෙහි කිරිමේ යෙදෙමු. "මාගේ ආත්මය ඔබගේ ශික්ෂා පැවැත්වීය, මම ඊට බොහෝසෙයින් ප්‍රේම කරමි"( ගීතාවලිය 119 : 167 ). ඔබගේ වචන මාගේ දිවට කොපමණ මිහිරිද! එසේය, ඒවා මාගේ කටට මී පැණි වලට වඩා මිහිරිය"( ගීතාවලිය 119 : 103 ). මෙසේ අප දෙවියන්වහන්සේගේ වචනයට ප්‍රේම කරන්නේ නම් අප හදවතේ මහත් සමාදානයක් අත්විඳිය හැක.

**3. බොහෝවූ සමාදානය**

**"බලව, මම ඊට සනීපයත් සුවයත් උපදවා, ඔවුන් සුව කොට. බොහෝ සමාදානය හා සැබෑකම ඔවුන්ට ප්‍රකාශ කරන්නනෙමි"(යෙරෙමියා 33 : 6 ).**

දෙවියන්වහන්සේ අපට දෙන යම් දෙයක් වේද එය බහුලව ලබා දෙන සේක. බහුලව දීම මිනිසුන්ට හුරුපුරුදු නැත. යොහාන් 14 : 27 හි ස්වාමීවූ යේසුස්වහන්සේ පවසනුයේ. "නුඹලා වෙත සමාදානය තබා යමි: මාගේ සමාදානය නුඹලාට දෙමි. මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ." උන්වහන්සේ අපට සමාදානය බහුලත්වයෙන් යුතුව දෙන සේක. ඇතැමෙකුගේ සමාදානය පවතින්නේ ඔවුන්ගේ වාතාවරණය යහපත්ව තිබෙන තාක් පමණි. යමෙකු වචනයක් දෙකක් සැරෙන් කතා කල පමණින් තම සමාදානය බිඳෙන කිතුණුවෝද අප සමඟ වෙති. අන් අය තමා ගැන පවසා ඇති දේ ගැන කනස්සලු වෙන්ට ඔව්හු පටන් ගනිති. ඇතැමෙකු මානසික පීඩා තත්වයකටද පත්වෙති. තමාට බොහෝ වූ සමාදානය ඇතැයි එවැනි ඇදහිලිවතුන්ට ප්‍රකාශ කළ නොහැක. යොරමියා 33 : 6 දේව වචනය අප ජීවිතය සඳහා දිනපතාම ඉල්ලා සිටීම

අපට වැදගත් වේ. ''ස්වාමීනී, ඔබවහන්සේ පොරොන්දු වී ඇති බොහෝ වූ සමාදානය මා හට එළිදරව් කළ මැනව'' යි යාච්ඤා කල යුතු වෙමු. දෙවියන්වහන්සේ දී ඇති මෙම අධික සමාදානය පසාරු කරන්නට හෝ බිඳ දමන්නට කිසි දෙයකට නොහැකිය.

## 4. උතුරා ගලන සමාදානය

**''අනේ. නුඹ මාගේ ආඥාවලට ඇහුම්කන් දුන්නා නම්. නුඹේ සමාදානය ගංගාවක් මෙන්ද නුඹේ ධර්මිෂ්ඨකම මුහුදේ රැළ මෙන්ද වන්නේය''( යෙසායා 48 : 18 ).**

දෙවියන්වහන්සේ අපට දෙන සමාදානය ගංගාවක් මෙන් යැයි දෙවියන්වහන්සේ මෙම පදයේ අපට ප්‍රකාශ කරන සේක. ගලන කොයි අත වුවද ගඟෙන් ජීවනය නික්මෙන්නේය. ගඟ ජීවන ආශිර්වාදය ගෙනෙමින් දුරස්තර පදෙස්වලට ගලා යයි. දෙවියන්වහන්සේ අප හදවතේ දෙන සමාදානය උතුරා ගොස් අන් අය වෙතට සේන්දු වේ. ඇදහිලිවතුන් සමාදානය කරන්නන් බවට පත්වන්නේ මෙසේය. පළමුව දෙවියන්වහන්සේ සමඟ සමාදානය පිහිටුවා ගැනීමට මනුෂ්‍යයාට උපකාර කරමු. දෙවනුව එකිනෙකා අතර සමාදානය පිහිටුවා ගැනීමට අපි මිනිසුන්ට ධෛර්ය දෙමු. උතුරායන සමාදානය තිබේ යැයි ඔබට සැබවින්ම කිව හැකිද? ඔබ වෙතින් උතුරා යන සමාදානය ඔබ අවට සිටින්නන්ට හැඟී තිබේද? ස්ටැෆර්ඩ් හොරේෂියෝ නැමැත්තා විසින් ලියනු ලැබූ ''ගංගාවක් මෙන් සමාදානය මා හදවතේ ගලන කල'' (When peace like a river attendeth my soul - යන ගීතය දහස් ගණනක් දෙනාට ආශිර්වාදය ලඟා කර දී ඇත. ඔහු මෙම ගීතිකාව ලියුවේ ඔහුගේ පුතා කහ උණ රෝගයෙන්ද, දූවරු සතර දෙනා නෞකා අනතුරකින්ද මිය ගිය පසුවයි. උතුරා ගලන සමාදානයක් තිබූ කිතුණුවෙක් පිළිබඳ ඔහු කදිම උදාහරණයකි. ගීතිකාවක් ආකාරයෙන් උතුරා ගලා ගිය ඔහුගේ සමාදානය බොහෝ දෙනෙකුට සමාදානයක් වී තිබේ. උතුරා ගලන ඔබගේ සමාදානය අන් අයට ආශිර්වාදයක් වනුයේ දුක්ඛිත සහ විපත්තිදායක අත්දැකීමක් තුලදීය. ඔබට එම උතුරා ගලන සමාදානය ලබාදෙන මෙන් ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලන්න.

## 5. කිසි නුවණකින් දැන ගත නොහැකි වූ දෙවියන්වහන්සේගේ සමාදානය

**''නුඹලා කිසි දෙයක් ගැන කණගාටු නොසිතා සියල්ලේදී ස්තුති දීම සමඟ යාච්ඤාවෙන්ද, කන්නලව්වෙන්ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන්වහන්සේට දන්වාපල්ලා. එවිට කිසි නුවණකින් දැනගත නොහැකි වූ දෙවියන්වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුල නුඹලාගේ සිත්ද සිතිවිලිද ආරක්ෂා කරනවා ඇත'' ( පිලිප්පි 4 : 6 -7 ).**

මෙම සමාදානය අප වෙත ළඟා වෙනුයේ යාච්ඤාව හේතු කොටගෙන. කණගාටුදායක ලෙස බොහෝ ඇදහිලිවතුන් යාච්ඤාව වෙනුවට කනස්සලුවීම තෝරා ගනිති. මෙම පදය තුලින් දෙවියන්වහන්සේ අපට පවසනුයේ කනස්සල්ල වෙනුවට යාච්ඤාව තෝරා ගන්නා ලෙසය. ''කිසි නුවණකින් දැනගත නොහැකි සමාදානය'' යනු මිනිස් ආකාරයෙන් අත්දැකිය නොහැකි වූ සමාදානයකි. යාච්ඤාව තම දරුවන්ට දෙවියන්වහන්සේ දුන් විශේෂ දායාදයකි. අප යාච්ඤාව ගැන සිතනුයේ අපගේ අවශ්‍යයතාවයටත් දෙවියන්වහන්සේ එය සැපයීමටත් අදාලවය. එහෙත් මෙම පදයෙන් අපට දෙවියන්වහන්සේ පවසනුයේ ''පිළිතුරු ලැබීමට'' වඩා ආශිර්වාද

යාච්ඤාව තුලින් අපට ලැබෙන බවය. අපගේ යාච්ඤාවට පිළිතුරු දීමට බොහෝ පෙරාතුව උන්වහන්සේ කිසි නුවණකින් දැන ගත නොහැකි වූ සමාදානය අපට ප්‍රදානය කරන සේක. ''යේසුස් මෙන් මිතුරෙක් ඇද්ද'' නම් ගීතිකාවේ අපි මෙසේ ගයන්නෙමු, '' ඕනෑ නැති දුක් බෝ කල ගත්තෙමුව සිතට , ඒ නොකී නිසයි සියල්ල යාච්ඤාවෙන් දෙවිඳුන්ට,'' ඔව්, අප යාච්ඤා නොකරන විට අපට අහිමි වනුයේ දෙවියන්වහන්සේගේ සමාදානයයි. ඇතැම්විට අපට යාච්ඤා කලත් අප ඉල්ලූ දේ දෙවියන්වහන්සේ අපට නොදෙන සේක. එහෙත් ඒ වෙනුවට උන්වහන්සේ ''කිසි නුවණකින් දැන ගත නොහැකි වූ සමාදානය'' දෙන සේක. මෙය යාච්ඤා කරන කිතුණුවකුගේ අසහාය අත්දැකීමකි. ඔබ යාච්ඤා කරන රෝගී ඥාතියාගේ ජීවිතය දෙවියන්වහන්සේ දීර්ඝ නොකරනවා වෙන්ට පුළුවන. එහෙත් ඒ වෙනුවෙන් ඔබගේ හදවත සමාදානයෙන් පුරවනවා විය හැක. අපගේ සමාදානය රඳා පවතින්නේ දෙවියන්වහන්සේ අප ඉල්ලීම් ඉටුකිරීම මත නොවන බව මතක තබා ගන්න. එහෙත් එය අපේ යාච්ඤා කිරීම මත රඳා පවතී. කිසි නුවණකින් දැන ගත නොහැකි වූ සමාදානය ඔබ අත් දැක නොමැති නම් ඔබ යාච්ඤාකර නොමැති බව කිව හැකිය. වර්තමාන ජනප්‍රිය කිතුණු ආගම. යාච්ඤාවට පිළිතුරු ලැබීම මුල් කොට ගෙන ගොඩ නැගී ඇත. එහෙත් දෙවියන්වහන්සේගේ ආගම ඔබේ අවශ්‍යයතාවය සැලසීමට වඩා සමාදානය ඔබට පිළිගන්වයි. දෙවියන්වහන්සේ යාච්ඤාවට පිළිතුරු වශයෙන් ඔබගේ සිතේ ආශාවන් සපුරනවා ඇත. එහෙත් උන්වහන්සේගේ පූර්ණ කැමැත්ත නම් ඔබගේ හදවත සමාදානයෙන් පිරවීමයි.

**6. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සමාදානය**

**''නුඹලා වෙත සදමාදානය තබා යමි: මාගේ සමාදානය නුඹලාට දෙමි. මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ. නුඹලාගේ සිත් කැළඹෙන්ටත් භයවෙන්ටත් නොදෙන්න'' ( යොහාන් 14 : 27 ).**

මෙම පදය සමාදානය පිළිබඳව ඇති ප්‍රබලම දේව වචන කොටස බව මම විශ්වාස කරමි. ස්වාමිවූ යේසුස්වහන්සේ තමන්ගේ සමාදානය අපට ප්‍රධානය කිරීමට පොරොන්දු වන සේක. ඔබ උන්වහන්සේගේ සමාදානය පිළිබඳව යමක් දන්නේද? එය නම් උන්වහන්සේගේ හදවත තුල ඇති සමාදානයයි. එම සමාදානය උන්වහන්සේට ලැබී ඇත්තේ සියළු දේ දැන ගැනීම සහ පරමාධිපත්‍යය කරණකොට ගෙනය. උන්වහන්සේ මුල පටන් අග දක්වා සියල්ල දන්නා සේක. එසේ හෙයින් උන්වහන්සේට කනස්සලු වීමක් නැත. සියල්ල උන්වහන්සේ විසින් නියම කර තිබේ. උන්වහන්සේ සියළු තීරණ ගෙන තිබේ. උන්වහන්සේ හා තරග වදින තරග කරුවෙකු නැත. උන්වහන්සේට කිසිවකු අභියෝග කරන්නේද නැත. උන්වහන්සේ පරාජය කිරීමට තරම් බලවත් සතුරෙක් නැත. එසේ හෙයින් උන්වහන්සේට මුළු පූර්ණ සමාදානය ඇත. පුදුම අතරිනුත් මහත් පුදුමය නම් එම සමාදානය උන්වහන්සේ අපට ප්‍රධානය කිරීමට කැමති වීමයි. එවැනි සමාදානයක් අපගේ හදවතේ දැරිය නොහැකි තරම්ය. එසේ වුවද උන්වහන්සේ අපට පොරොන්දු වනුයේ උන්වහන්සේගේම සමාදානය අපට දෙන බවය. එනිසා අපි යාච්ඤා කරමින් මෙසේ ඉල්ලමු. ''ස්වාමීනී මට ඔබේ සමාදානය දුන මැනව. අන් සමාදානයක් මට අවශ්‍යය නැත. ඔබවහන්සේගේ හදවතේ ඇති සමාදානය දුන මැනව'' ප්‍රේමවන්තයෙනි, එවන්

සමාදානය අපට ලැබුනේ, මේ ලොවේදී අපි දෙවියන්වහන්සේගේ සැළසුම සහ වැඩසටහන දැනගත්විටදීය. එම සැලසුම අපට බයිබලයේ එළිදරව් වේ. ආරම්භයේදී අහසත් පොළවත් මැවීමේ පටන් යළි අලුත් අහසත් පොළවත් මැවීම දක්වා කරුණු එහි සඳහන්වේ. අප එය මුලින්ම විශ්වාස කරන්නේ නම් උන්වහන්සේගේ සමාදානය අත්දැකීමට අපිත් පටන්ග න්නෙමු. උන්වහන්සේගේ දෘෂ්ඨි කෝණයෙන් ලොව දෙස බැලීමට අපත් ඉගෙන ගනිමු. එහි ප්‍රතිඵලය වනුයේ උන්වහන්සේගේ සමාදානයෙන් අපගේ හදවත පූර්ණ වීමයි.

**7. හදවතේ රජයන සමාදානය**

**"ක්‍රිස්තුස්වහන්සේගේ සමාදානය නුඹලාගේ සිත්වල ආණ්ඩුකෙරේවා. ඒ පිණිස නුඹලා එක ශරීරයක්ව සිටීමට කැඳවනු ලැබුවහුය. ස්තුතිවන්තවද සිටින්න" ( කොලොස්සි 3 : 15 )**

මෙම පදයෙන් අපට කතා කරනුයේ හදවතේ රජයන සමාදානය ගැනයි. මෙම සමාදානය අපට ලැබෙනුයේ අප ජීවිතය මුළුමනින්ම ස්වාමීන්වහන්සේට යටත් කලවිටයි. අපේ ජීවිත අපම පාලනය කරන තාක් කල් දෙවියන්වහන්සේගේ සමාදානය අපේ සිතේ රජයෑම සිදුවිය නොහැකිය. ගීතිකා කතුවරයා කියන පරිදි ඔහුගේ මුළු දිවියත්. සියල්ලත් ස්වාමීන්වහන්සේට යටත් කර තිබේ යැයි ඔබට කිව හැකිද? "යටත් කරමි සෑම දේම යේසුස් හිමිට පෙම්වත්. සේවයේ යෙදෙමි එතුමන් කැප කොට මා දිවිත්". ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයෙහි අවයවයක් සේ ප්‍රීතිමත්ව ජීවත් වීමට කැමති නම් ක්‍රිස්තුස්වහන්සේට අපේ ජීවිත මුළුමනින්ම යටත් කල යුතු වේ. අද ක්‍රිස්තුස්වහන්සේගේ සිරුර වන සභාව තුල බොහෝ කැළඹීම් තිබේ. ඒ රජයන සමාදානයේ හිඟකම නිසාය. රජයන සමාදානය අත්දැකීම පිණිස ඔබේ ජීවිතය ක්‍රිස්තුස්වහන්සේගේ පාලනයට යටත් කරන්න.

**නෙවිල් ජයසුන්දර**

---

**2 පිටුවෙන්.....**

❖ සැමියා ඔබගේ ආදරය අපේක්ෂාවෙන් සිටින බව නිතර මතක තබා ගන්න. ඔහුගේ මහන්සිය, කාන්සිය හා ආතතියට ඔබගේ ආදරය හොඳ ඖෂධයක් කරන්න.

❖ ඔබගේ ජීවිතයේ සියළු දවස් වලදී ඔබගේ දෙවියන්වහන්සේටත්, ගැළවුම්කරු හා ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේටත් නිරන්තරයෙන් ස්තුති, ප්‍රශංසා, නමස්කාර කරන්න. ඔබ දේව භය සහිත භාර්යාවක් ලෙස සැමියාට එත්තු යන ආකාර ජීවිතයක් ගත කරන්න.

❖ සැමියා කැමති ආකාරයට රසට කෑම පිසීමට ඉගෙන ගන්න. තිබෙන දෙයින් ප්‍රනීත කෑම වේලක් පිළියෙල කිරීමේ හැකියාව ඉතාමත් වැදගත්.

❖ ගෙදර පිළිවෙලකට සහ පිරිසිදුව තබා ගැනීමට උනන්දු වන්න.

❖ අරපිරිමැස්ම සහ චාම් භාවය ප්‍රගුණ කරන්න.

❖ මෘදු වචන සෙමෙන් කතා කරන්න.

❖ කඩිසර, ඍජු, අවංක, ප්‍රේමනීය, කරුණාවන්ත, පමණාදැන ක්‍රියා කිරීම වැනි ගුණාංග හිතාමතාම ඇති කරගන්න. අන් ස්ත්‍රීන් සමඟ තරඟයට නොයා තමන්ට අනන්‍යයතාවයක් ගොඩ නගා ගන්න. සරල ජීවන රටාවකට හුරුවන්න.

**තබීතා**

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ යාච්ඤා ජීවිතය

ගියවර කලාපයෙන් යේසුස්වහන්සේ තම දින චර්යාව තුල දෙවියන්වහන්සේට යාච්ඤා කල අවස්ථා කිහිපයක් සලකා බැලුවේ දේව වචනයේ ආලෝකයෙනි. එහි අපගේ යාච්ඤා ජීවිතයට ආදර්ශයක් උන්වහන්සේගේ ජීවිතයෙන් ලබා ගත්තෙමු.

**යේසුස්වහන්සේ කළ යාච්ඤා**

උන්වහන්සේගේ යාච්ඤා ජීවිතය හොඳින් සලකා බැලීමේදී විශේෂ කාරණා කිහිපයක් පිළිබඳව වඩා අවධාරනයෙන් යාච්ඤා කල බව පෙනෙන්නට තිබේ. යොහාන් 17 වැනි පරිච්ඡේදයේ ලියවී ඇති උන්වහන්සේගේ උත්තම පූජක යාච්ඤාවේ විශේෂ ඉල්ලීම් කිහිපයක් ඇත. යොහාන් 17 වන පරිච්ඡේදයේ සඳහන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ යාච්ඤාව ඉතා ප්‍රවේශමෙන් කිහිප විටක් කියවන්න. එවිට ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් එම යාච්ඤාව කරන විටදී යේසුස්වහන්සේ තුල තිබුණු හැඟීම් සහ ආත්මය මනාවට පෙන්වා දෙනු ඇත.

**1 - පුත්‍රයා ගෞරවයට පැමිණෙව්ව මැනව - යොහාන් 17 : 2**

තම පියාණන්වහන්සේගෙන් උන්වහන්සේ ඉල්ලා සිටියේ තමන් ගෞරවයට පමුණුවන ලෙසය. මෙම ඉල්ලීම නැවත යොහාන් 17 : 5 හි සඳහන් කරමින් යේසුස්වහන්සේ යාච්ඤා කල සේක. තමන්වහන්සේ මේ ලෝකයට මනුෂ්‍යයාකාරයෙන් පැමිණීමට ප්‍රථම යේසුස්වහන්සේට තිබූ ගෞරවය හා මහිමය නැවත ලබා දෙන මෙන් තම පියාණන්වහන්සේගෙන් ඉල්ලා සිටි සේක. පිලිප්පි 2 : 5-6 සඳහන් වන ආකාරයට යේසුස්වහන්සේ පියාණන්වහන්සේ සමඟ වැඩ සිටියේ කුමන ආකාරයකටදැයි මෙහි සඳහන් වේ. මේ වන විටත් යේසුස්වහන්සේ තමන් මරණයට පත්වන බවත් මනුෂ්‍යය සංහතියේ පාපය තමන් විසින් ඉසිලිය යුතු බවත් දැන සිටියහ. යේසුස්වහන්සේගේ ඉල්ලීම වූයේ ස්වර්ගයේ තමන්වහන්සේට පෙර තිබූ මහිමය, තේජස, කීර්තිය, අධිකාරිත්වය, ශ්‍රී විභූතියෙහි තමන්වහන්සේ නැවත පිහිටු වන ලෙසය. එය ඉටු වූ බව පසුව දේව වචනයේ පෙන්වාදෙයි. වත්මන් කිතුණු අනුගාමිකයන් වන අපද නිරන්තරයෙන්ම දෙවියන්වහන්සේට යාච්ඤා කන්නලව් කරන්නෙමුව. ඒ බොහොමයක්ම ද්‍රව්‍යයාකාර දේ ලබා ගැනීමට බව හොඳින් සෝදිසිකර බැලූ කල අපට පෙනී යනු නොඅනුමානය. නමුත් පුත්‍රයාණන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගෞරවයට පත් වන ආත්මික කාරණා පිළිබඳ අපි යාච්ඤා කිරීමට වඩා උත්සහ කරමු. සියළු ඇදහිලිවන්තයන්ගේ සදාකාල ආරක්ෂාව රැඳී තිබුණේ පුත්‍රයාණන්වහන්සේ තේජසට පත්වීම නොහොත් මළවුන්ගෙන් නැගිට නැවත ශ්‍රී විභූතියට පත්වීම මතයි.

**2 - "එකත්වය වන පිණිස ඔවුන් ආරක්ෂා කල මැනව"**

ස්වාමී වූ යේසුස්වහන්සේ තම පියාණන්වහන්සේට යාච්ඤා කරන විට අවධාරණය කල තවත් කාරණයක් වන්නේ උන්වහන්සේගේ ගෝලයන්ගේ එක්සිත් භාවය ආරක්ෂා කර ගැනීමයි. මක්නිසාද ඔවුන් විවිධ ගති පැවතුම් හා චරිත ඇති පුද්ගලයින් බව ශුභාරංචි පොත් කියවීමේදී අපට පැහැදිලි වනු ඇත. එවැනි අය එක් කාරණයකට එකඟ කර ගැනීම අති දුෂ්කර බව යේසුස්වහන්සේ තම ප්‍රඥාවෙන්

හා අත්දැකීමෙන් දැන ගෙන සිටියහ. එම නිසාම තම ගෝලයන්ගේ එක්සිත් භාවය රැක දෙන ලෙස තම පියාණන්වහන්සේගෙන් පිහිට උපකාරය ඉල්ලා යාච්ඥා කල සේක. ඒ වන විට ගෝලයන්ගේ එක්සිත් භාවය ඉතාමත් වැදගත් සාධකයක් බවට පත් වී තිබුණි. සභාව පිහිටු වීමට හා එය පෝෂණය කිරීමට තෝරා ගනු ලැබ සිටියේ මෙම පිරිස නිසාවෙනි.

අද දින යේසුස්වහන්සේගේ මැදහත්කාරකම නිරන්තරයෙන් දේව දරුවන් උදෙසා ස්වර්ගයේ සිදු කරන සේක. ඇදහිල්වන්තයන්ගේ එක්සිත් භාවය හා එක්සිත්කම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහත් ආශාවයි. දේව දරුවන් බේද බින්න වී සිටින විට යක්ෂයා මහත් ප්‍රීතියකින් ප්‍රීති වන අතර දෙවියන්වහන්සේගේ රාජ්‍යය නොහොත් සභාව දුර්වල බවට පත්වෙයි. දේව දරුවන් එක්සත්ව එක්සිත්ව සිටින විට යක්ෂයා මහත් කලබලයටත් , දුර්වල බවටත් පත්වන අතර සභාව මහත්සේ වර්ධනය වෙයි. දේව සේවකයන්ගේ හා ඇදහිලිවන්තයන්ගේ එක්සිත් භාවය වර්තමානයේ බොහෝ දුරට බිඳී ගොස් ඇති බව මාගේ හැඟීමයි. මෙය මහත් භයානක ප්‍රතිඵල ගෙන දෙන වාතාවරණයක් හා අවධානමකි. සභාව ලෞකික වීම සහ සභාවට පාපය ඇතුළු වීම, පාපය ගණන් නොගෙන සිටීම, පාපය පාපය ලෙස අර්ථ දැක්වීමට හා විග්‍රහ කිරීමට මැලි වීම, ඒ තුලින් දෙවියන්වහන්සේ අප්‍රසන්න කරන ජීවිත බවට ඇදහිලිවන්තයන්ගේ ජීවිත පත්වීම වැනි භයානක ප්‍රතිඵල ගෙන දෙයි. එක්සිත්භාවය බිඳීයාම කරණකොටගෙන සහභාගිකමේ දුර්වල වන ඇදහිල්වන්තයන් එකිනෙකා අතර සබැඳියාව අඩපණ වේ, ඒ කරණකොටගෙන යාක්ෂයාගේ උගුල්වල වැටී ආත්මිකව දුර්වල වේ. එබැවින් අපත් යේසුස්වහන්සේ සමඟ එකඟ වී දේව දරුවන්ගේ එක්සිත් භාවය උදෙසා යාච්ඥා කරමු.

**3 - "නපුරාගෙන් ඔවුන් ආරක්ෂා කරන පිණිස"**

යේසුස්වහන්සේගේ යාච්ඥාවේදී ඉතා අවධාරණය කරන කරුණක් වන්නේ නපුරා වන යෂයාගෙන් ජය ගැනීමයි. තම අනුගාමිකයන් නපුරාගෙන් ආරක්ෂාකරන පිණිස තම පියාණන්වහන්සේගෙන් ඉල්ලා සිටින සේක. මක්නිසාද යේසුස්වහන්සේ සාතන් පිළිබඳව හොඳින් දනියි. ඔහුගේ බලය, කෛරාටික බව, නපුරුකම හා උපාය මාර්ග පිළිබඳව යේසුස්වහන්සේට හසල දැනුමක් තිබේ. දෙවියන්වහන්සේගේ පුත්‍රයා වන යේසුස්වහන්සේටත් විවිධ පරීක්ෂාවන් සාතන් විසින් ගෙන එන ලදී. ඔහු සැම විටම දෙවියන්වහන්සේටත් උන්වහන්සේගේ දරුවන්ටත්, උන්වහන්සේගේ රාජ්‍යයටත් විරුද්ධව නිතර කුමන්ත්‍රණ සිදුකරන අතර ඊට විරුද්ධව ඉතාමත් සූක්ෂම සැලසුම් සහගතව තම ගෝලයන් සමඟ ක්‍රියාකරමින් නපුරුකම් කරයි.

අපත් යක්ෂයාට විරුද්ධව නිතර යාච්ඥා කල යුතු බව යේසුස්වහන්සේ අපට මතක් කර දෙන සේක. අපගේ සතුරා මිනිසුන් නොව යක්ෂයා සහ ඔහුගේ සේනාවයි.

**"මක්නිසාද අපගේ පොර බැදීම වනාහි මාංසයට සහ රුධිරයට විරුද්ධව නොව අධිපතිකම් වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථාන වල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය" (එපීස 6 : 12)**

**එස්. මෙත්තානන්ද**

# දරුවා සහ දඬුවම

**මෝඩකම දරුවකුගේ සිතට බැඳී තිබේ. දඬුවම් කිරීමේ ඉපල එය ඔහුගෙන් දුරුකරයි (හිතෝපදේශ 22 : 15).**

"දරුවෝ" ලිපි පෙලින් මෙතෙක් අප සාකච්ඡා කරනු ලැබුවේ දරුවන්ගේ භාරකරුවන්ගේ වගකීම් සහ ජීවිත රටාව පිළිබඳවයි. තව දුරටත් එම විෂය පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අපට අපගේ දරුවන්ගේ ජීවිත "නියම" මාර්ග යේ ගොඩනගා ගැනීමට මහෝපකාරී වේ යැයි සිතමි.

ඉහත දේව වචන කොටසේ ශුද්ධාත්මයාණන්වහන්සේ අපට දරුවන් පිළිබඳව මහත් සත්‍යයක් එළිදරව් කරයි. "මෝඩකම දරුවන්ගේ සිතට බැඳී තිබේ." මෙය අපගේ ව්‍යවහාර භාෂාවෙන් කියතොත්, මෙසේ කිව හැක. "ඔවුන්ට හොඳ නරක හරිහැටි නොතේරෙයි." දරුවන්ගේ හදවතේ මෙම ස්භාවය නිසා බොහෝ විට ඔවුන් විවිධාකාර ගැටළු වලට සහ තාඩන පීඩන වලට භාජනය වෙයි. දුර දක්නා නුවණකින් යුතුව තීරණ ගැනීමට හා වැඩකිරීමේ හැකියාවක් දරුවන්ට නැත. ඒ වෙනුවට, හැඟිම්බර සහ අවස්ථානුකුව ක්‍රියා කිරීම දරුවන්ගේ ස්භාවයයි. දරුවා නිතරම තමාගේ නුවණෙහි පිහිටා ක්‍රියා කරන අතර, ඕනෑම දෙයක්, ඕනෑම කෙනෙකු විශ්වාස කිරීමට පෙළඹෙයි. ලාමක, බොළඳ සහ අනතුරුදායක දේවල් කිරීමට දරුවන් පෙළඹෙන්නේ ඔවුන්ගේ මෙම සහජ දුර්වලතාවය නිසා බව වැඩිහිටියන් වන අප මතක තබා ගත යුතුය. තමාට යහපත කරන්නා හා අයහපත කරන්නා හඳුනා ගැනීමට දරුවාට ඉතා අසීරුය. එම නිසා දරුවන් රැවටෙන සුළුය. මෙම ස්භාවය මෝඩකම ලෙස දේව වචනය හඳුන්වා දෙයි. මෙය දරුවන්ගේ ස්වභාවික තත්වයයි. එය දරුවාට අවාසිදායක, අනතුරුදායක හා භයානක තත්වයකි.

## දඬුවම් කිරීමේ ඉපල

මෙහි දඬුවම හා ඉපල ගැන සඳහන් වුවත් එහි අර්ථය ශාරීරික රිදවීම සහ කෝටුවකින් පහර දීමත් දරුවාට මග පෙන්වීම හා අවබෝධ කර දීමත් අදහස් වන බව මාගේ හැඟීමයි. වත්මන් සමාජය දරුවන්ට ශාරීරික දඬුවම් ලබා දීම අනුමත නොකර සිටින ස්භාවයක් සහ සමාජ මතයක් ගොඩනැගී පවතී. එහෙත් අප අතීත සමාජයේ දරුවන්ට ශාරීරික දඬුවම් කිරීම සුලබව තිබුණු බව දක්නට ලැබේ. නිවසේදී හෝ පාසලේ දී වරදක් කල විට දරුවන්ට දඬුවම් විඳීමට සිදුවිය. ශාරීරික දඬුවම් වලින් ප්‍රයෝජන ටිකය. නමුත් දරුවාගේ මෝඩකම හා බැඳී පවතින මුරණ්ඩුකම දුරු කිරීමට ඉපල පාවිච්චි කිරීමට සිදුවේ. ඊට දෙවියන්වහන්සේ අවසර දෙන සේක. එහෙත් ප්‍රේමවන්ත මග පෙන්වීම තුලින් දරුවන්ගේ "මෝඩකම" බොහෝ දුරට ඔහුගෙන් දුරස් කිරීමට හැකි වනු ඇත. එනම්, පළමුව දෙමව්පියන් විසින් දරුවන්

සමග සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගත යුතු අතර එහෙත් මව්පිය - දූ දරු පරතරය ඉතා හොඳින් පවත්වා ගත යුතුය.

1) දරුවාගේ අත්දැකීම් හා සිදුවීම් දිනපතා දෙමව්පියන් සමග බෙදා ගැනීමට ඔවුන්ට ඉගැන්විය යුතුය.

2) දරුවන්ගේ අවශ්‍යයතාවයන් නොපැකිලව පැවසීමට ඉඩ දිය යුතුය.

3) දරුවන්ගේ හැඟීම් ප්‍රකාශ කිරීමට සුදුසු හා නිදහස් පරිසරයක් නිවස තුල සලසා දිය යුතුය.

නිවස දරුවාට හොඳ-නරක උගන්වන පළමු පාසල බවට පත්කිරීමට අපට හැකිනම්, දරුවන්ගේ බොලඳ කමෙන් බොහෝ දුරට ඔවුන්ට ජයග්‍රහණය කල හැකි වනු ඇත. සමහර පියවරුන්ට දරුවන් මර භයය. ශබ්ද නගා ගීතයක් ගායනා කිරීමට, රූපවාහිනිය නැරඹීමට, විනෝදයෙන් මිදුලේ සෙල්ලම් කිරීමට බැරි තරම්ය. දරුවා දවසේ වැඩි වේලාවක් නිවසේ රඳවා ගැනීම සඳහා විවිධ ක්‍රම සහ උපායන් සලසා ගැනීම මඟින් පවුලට සෙනෙහස දැක්වීමටත්, තම මව් පියන්ට ගෞරව කිරීමටත් දරුවන් තුල ආශාවක් එහ උද්යෝගයක් ඇති කල හැකිය.

ප්‍රිය වචන දරුවන්ට කතා කිරීම ඉතාමත් වටිනා දෙයකි. පුතා, දුව, ලොකු දුව, පොඩි පුතා වැනි ආමන්ත්‍රණ අප රටේ මව්පිය - දූ දරු සෙනෙහස හා සම්බන්ධතාවය වැඩි වී ඇති, වචන ලෙස හැඳින්විය හැකිය. අප සමාජය බටහිරකරණය වෙමින් පවතින නිසදෝ දැන් දැන් දරුවාගේ නමින් දරුවන් ඇමතීමට පුරුදු වී ඇත. එය හොඳ ක්‍රමයක් නොවන බව මාගේ හැඟීමයි.

### ඉපල නොහොත් නිවැරදි කිරීම

බයිබලයේ ඉපල ලෙස හඳුන්වන්නේ වේවැල යැයි සමහරු අර්ථ දැක්වීමට උත්සහ කලත්, එය එතරම් නිවැරදි අර්ථ දැක්වීමක් නොවේය. සමහර විට කුඩා කාලයේදී දරුවන්ට වේවැලක් පාවිච්චි කර ඔවුන්ට යම් දඬුවමක් දීමට හැක. එහෙත් දරුවන් උස මහතින් හා බුද්ධියෙන් වර්ධනය වූ විට එම දඬුවම් ක්‍රමය සාර්ථක නොවන බව ඔබට මනාව වැටහේවි. දරුවන්ගේ ජීවිතයට බලපාන පාපයන්, දුරාචාර හා අකීකරුකම් ඔහුගේ ජීවිතයෙන් දුරු කිරීමට අප උපයෝගී කර ගන්න විනයානුකූල දඬුවම් ක්‍රම උපායන් බවට පත්විය යුතුය. සාකච්ඡා කිරීම ඉන් ප්‍රධාන වශයෙන්ම කල හැකි හොඳම උපාය මාර්ගයකි. දරුවන්ගේ ජීවිතය දෙවියන්වහන්සේගේ මාර්ග යේ පුහුණු කිරීමට නම් විනයානුකූලව දඬුවම අත්‍යාවශ්‍යය. නිතිරිති පැනවීම, නිදහස අඩු කිරීම. මුදල් නොදීම වැනි ඔබගේ දරුවාට ගැලපෙන ආකාරයේ දඬුවම් පැනවිය හැක. ඉන් පලක් නොවේ නම් ඉපල පාවිච්චි කිරිමට හැක. ඉපල පාවිච්චි කිරිමෙන් දරුවාගේ මුරණ්ඩුකම හා සිතේ තද ස්වභාවය බිඳිය හැක. දරුවාගේ මෝඩකම යනු මුරණ්ඩුකම මිශ්‍ර නොදැනුවත්කම වේ. එමෙන්ම පාපය නිසා ඇතිවුන සිතේ තද කුලල් ගතියට දරුවා ජන්මයෙන් උරුමකම් කියයි. මෙම ගතිය දරුවාගෙන් දුරු කිරීමට ඉපල පාවිච්චි කිරීමට පුළුවන. ඊට දෙවියන්වහන්සේ අවසර දෙන සේක. දෙවියන්වහන්සේ මනෝවිද්‍යාඥයන්ට වඩා ඥානවන්තය. මනෝවිද්‍යාවට වඩා දෙවියන්වහ්සේගේ වචනය නිවැරදිය.

**එස්. මෙත්තානන්ද**

# ළමා පිටුව



## මම වෙනත් කෙනෙකු නොව මමම වෙමි!

**මම ඔබට ස්තුති කරන්නෙමි. මක්නිසාද මම භයානක ලෙසත් පුදුම ලෙසත් සාදන ලද්දෙමි. (ගීතාවලිය 139 : 14)**

ආදරණීය දුවේ, පුතේ, කොහොමද ඔබේ තොරතුරු? ඔබ ඉගෙනුමේ කටයුතු ඉතා උනන්දුවෙන් කරනවා ඇතැයි කියා මම විශ්වාස කරනවා. ඔව් දුවේ පුතේ ඔබ එලෙස කළහොත් 2014 වර්ෂය ඔබට ඉතාමත් ආශිර්වාදලත් වසරක් වනවාට කිසිදු සැකයක් නැහැ. ඉතිං දුවේ පුතේ අද මං ඔබේ ජීවිතයට වටිනා තවත් දෙයක් එකතු කර දීමට සතුටුයි.

දුවේ, පුතේ අද අප අතර බොහෝ දෙනෙක් විවිධ පුද්ගලයින්ව අනුකරණය කරනවා. සමහරු නළු නිළියන්, ගායක ගායිකාවන් වැනි තමන් ආස කරන ප්‍රසිද්ධ අයවත් නැතිනම් තමාගෙම වයසෙ ඉන්න ගුරුවර ගුරුවරියන්ගෙ ආදරයට පාත්‍ර වන ළමුන්වත් අනුකරණය කරනවා. මොකක්ද මේ අනුකරණය කරනවා කියන්නෙ? තමන් ආස කරන පුද්ගලයා වගේ පෙන්වීමට උත්සාහ කිරීමයි. ඒ කියන්නෙ අපි ඒ ආස කරන තැනැත්තා වගේ වෙලා අනිත් අයගෙන් ආදරය, ප්‍රසිද්ධිය ලබා ගැනීමට වෑයම් කිරීමයි. ඒ කියන්නෙ අපි අප ගැන හොඳ ආකල්පයක් නැති නිසා අපිව යටපත් කරලා අපි යහපත් ලස්සනයි දක්ෂයි කියන අයවතමාට ආදේශ කර ගැනීමයි. අපි අවට සිටින යහපත් පුද්ගලයින්ගෙ ජීවිත තුළින් අපි දකින යහපත් දේවල් අපේ ජීවිතයට එකතු කර ගැනීම ඉතා හොඳ දෙයක්. නමුත් දුවේ, පුතේ අපි අපිම නොවී, අපව යටපත් කොට වෙනත් කෙනෙකුව පෙන්වීම හරියටම අර වෙස් මූණක් දමා රඟ පෑමක් කිරීම වගෙයි. දුවේ පුතේ මොහොතක් ගෙන ඒක යහපත්ද කියා ඔයගොල්ලන්ම සිතා බලන්න.

ආදරණීය දුවේ, පුතේ, මේ ලෝකයට ඉපදෙන සෑම මනුෂ්‍යයෙක්ම සම්පූර්ණයෙන්ම රූපයෙන් ගතිගුණවලින් දක්ෂතාවයන්ගෙන් වෙනස්. සමහර විට නිඹුල්ලු ලෙස ඉපදුණ අයගෙ රූපයේ සමානකමක් තිබුණත් ඔවුන් අතරත් බොහෝ වෙනස්කම් තිබෙනවා. විශේෂයෙන්ම සෑම මනුෂ්‍යයෙකුගේම හිසකෙස් ඇඟිලි තමුන්ටම සුවිශේෂී වෙනවා. එයයි විශ්මය වනුයේ. අන්න ඒ නිසයි, අත්සන් කිරීමට හෝ රහස් පරීක්ෂක කටයුතු සඳහා හිසකෙස්, ඇඟිලි සලකුණු භාවිතා කරන්නෙ. දෙවියන්වහන්සේ මේ ලෝකයේ මනුෂ්‍යයින්ව වෙනස් අයුරින් මවා තිබෙන්නෙ තවත් කෙනෙකුව අනුකරණය කර ඒ තැනැත්තාව ප්‍රති රූපනය කිරීමට නම් නොවෙයි. අපි අපම සිටින ආකාරයෙන් ජීවත් වීමට මිසක් නමුත් මේ ලෝකයේ ජීවත්වන මනුෂ්‍යයින්ව අනුකරණය කිරිමෙන් නම් නොවෙයි.

දුවේ, පුතේ අනුකරණයේ තවත් අයහපත් පැත්තක් තමයි, අපි අනුකරණය කරන පුද්ගලයාගේ අපට අකමැති යම් නරක දෙයක් අපට දැන ගැනීමට සිදුවුණහොත් ඒ පිළිබඳව අප කළකිරීමටත් කණගාටුවටත් අප පත්වෙනවා. එවිට අපිට තවත් ඒ තැනැත්තාව අනුකරණය කිරීම එලක් නැහැ කියා සිතෙනවා. එවිට අපි අතරමංවූවා සේ අපටම දැනේවි. එවගේම දුවේ පුතේ අපි කොපමණ අනික් අයව අනුකරණය කළත් විටින් විට අපේ සැබෑ ස්වභාවය මතු වෙනවා. ඒ නිසා අපට අනුකරණය මහත් වෙහෙසකාරී දෙයක් වනු නො අනුමානයි. එවගේම දුවේ, පුතේ අනුකරණය නිසා බොහෝ විට සිදුවන්නේ තමන්ට උරුම වී ඇති මනා පෞරුෂත්වය කඩාකප්පල් කොට දැමීමයි. තමාව තමා තුළම අතරමං කරන පුහු අනුකරණයට වහල් නොවී ඔබ ඔබම වී සමාජයට රටට වටිනා පුද්ගලයෙකු බව ඔබ ඔබගේ ගතිගුණාංග වලින්ම ඔප්පු කරන්න. දැන් ඔයගොල්ලන්ටම අනුකරණයෙන් නිසා ලබන අයහපත් දේවල් පිළිබඳව මනා වැටහීමක් ඇති වුණා කියා මං සිතනවා. ඒ නිසා දුවේ, පුතේ අපි තව දුරටත් වෙන කෙනෙකු නොවී නිතරම අපේ දක්ෂතාවයන් තවත් ඔප දමාගෙන තමන්වම අනිත් අයට දැකීමට සලස්වමු. ඔබට යේසු පිහිටයි!

**තෙල්මා නැන්දා**

# දුරකථන යාච්ඤා සේවය

ඉල්ලාපල්ලා නුඹලාට දෙනු ලබන්නේය.
යේසුස්වහන්සේ කී සේක. (මතෙව් 7:7)

අසනීප, දුක් කරදර, තනිකම, යක්ෂභූත දෝස හා බලපෑම්, ආදී ජීවිතයේ ඕනෑම කරදරකාරී වාතාවරණයක් උදෙසා හොඳම සරණ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සතු බලය, ප්‍රේමය, හා කරුණාව කරණකොට ගෙන ඕනෑම මනුෂ්‍යකුට පිහිට වන සේක. ඔබත් උන්වහන්සේව විශ්වාස කරන්න. ඔබගේ අවශ්‍යතාවය උන්වහන්සේට කියන්න. යේසුස්වහන්සේ ඔබව නිදහස් කරයි.

## 0778813197

(පාන්දර 4.00 සිට උදෑසන 6.00 දක්වා පමණක් අපව අමතන්න)

මෙම දුරකථනයට අමතන්න.

අප ඔබ උදෙසා යාච්ඤා කිරීමට සූදානම්ය.

ඇදහිල්ල නැතුව දෙවියන්වහන්සේ
ප්‍රසන්න කරන්නට නුපුළුවන.
දෙවියන්වහන්සේ වෙතට ළඟා වෙන්නා විසින්
උන්වහන්සේ සොයන්නන්ට විපාක දෙන
කෙනෙකු බව විශ්වාස කරන්නට ඕනෑය.
(හෙබ්‍රෙව් 11:6)